# කාර්යසාධන වාර්තාව - 2025

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය:- 216


සමාජ සේවා දෙපාර්තමේන්තුව

දෙවන මහල

සෙත්සිරිපාය - II අදියර

බත්තරමුල්ල

| | | |
|---|---|---|
| දුරකථන | - | 0112187040 |
| ෆැක්ස් | - | 0112186276 |
| ඊ - මේල් | - | director@socialservices.gov.lk |
| වෙබ් අඩවිය | - | www.socialservices.gov.lk |

# පටුන


## 01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 3-4 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 5 |
| 1.3 | ප්‍රධාන කාර්යන් | 6 |
| 1.4 | සංවිධාන සටහන | 7 |
| 1.5 | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින අංශ හා ආයතන | 8-17 |
| 1.6 | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් | 18 |
| 1.7 | විදේශ තාක්ෂණික ආධාර ලබන ව්‍යාපෘති, රාජ්‍ය නොවන සංවිධානවල අනුග්‍රහයන් මඟින් සිදුකරන ලද වැඩසටහන්වල තොරතුරු | 18-19 |

## 02 වන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

| | | |
|---|---|---|
| 2.1 | ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහන | 20-34 |
| 2.2 | මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය හා සමාජ ගත කිරීමේ ව්‍යාපෘතිය | 35 |
| 2.3 | ආබාධ සහිත ප්‍රජාව සඳහා රැකියා සහාය ප්‍රවර්ධනය සඳහා වන ව්‍යාපෘතිය | 36 |
| 2.4 | පර්යේෂණ ඒකකයක් පිහිටුවීම | 37 |
| 2.5 | දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය | 37 |
| 2.6 | ජයග්‍රහණ | 38 |
| 2.7 | අභියෝග | 38 |
| 2.8 | ඉලක්ක | 39 |

## 03 වන පරිච්ඡේදය - වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

| | | |
|---|---|---|
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 40-42 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 43 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 44-45 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 45 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 45 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 46 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 46 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 46 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 47-55 |

## 04 වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

| | | |
|---|---|---|
| 4.1 | ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 56 |

## 05 වන පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

| | | |
|---|---|---|
| 5.1 | හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG) | 57-58 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයගහණ හා අභියෝග | 58 |

## 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

| | | |
|---|---|---|
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 59-61 |
| 6.2 | ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තය බලපාන ආකාරය | 62 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 62-67 |

## 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| | | |
|---|---|---|
| 7.1 | අනුකූලතා වාර්තාව | 68-74 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

සුරක්ෂිත හා අන්තර්කරණීය සමාජයක අභිමානයෙන් යුතුව ජීවත්වීම පිණිස ආන්තිකරණය හා අවාසිසහගත තත්ත්වයට පත් වූ සැම නැනැත්තෙකුම සවිබල ගැන්වීමේ දැක්ම අනුව කටයුතු කරන සමාජ සේවා දෙපාර්තමේන්තුව ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ සිය කාර්යභාරය ඉටු කරනු ලබයි. දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් 2025 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගත් විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ක්‍රියාත්මක කොට ඇත. ඒ අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2025 වර්ෂයේ සිදුකරන ලද ක්‍රියාකාරකම් වලට අදාළ සමස්ත තොරතුරු මෙහි අන්තර්ගත වේ.

එහිදී ආබාධ සහිත තරුණ තරුණියන් තම නිවසට, ප්‍රජාවට වැඩදායක පුරවැසියන් සේ සමාජයේ ස්වාධීනව ජීවත් වීමට අවශ්‍ය දැනුම, කුසලතා, හා ආකල්ප සංවර්ධනය කර ඔවුන් ජාතික ශ්‍රම බලකායේ සක්‍රිය කොටස්කරුවන් කිරීම අරමුණ කර ගනිමින්, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෘත්තීය පුහුණු ආයතන 11ක් තුළින් ඒ සඳහා අවස්ථාව සලසා දී තිබේ.

එසේම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආබාධ සහිත ප්‍රජාව සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීමේ අරමුණින් ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (CBR) විධිමත් ක්‍රමවේදයන් අනුව ක්‍රියාත්මක වේ. මෙහි එක් අංගයක් ලෙස දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මීට අමතරව දිවයින පුරා රෝහල් 18ක් තුල රෝහල් ගතව සිටින ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

එසේම මුල් ළමාවියේදීම ළමුන්ට ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම සඳහා කල් ඇතිව මැදිහත් වී අවශ්‍ය සේවා පහසුකම් සැපයීම වෙනුවෙන් නාවින්න සහ සිතිජය යන ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හරහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මීට අමතරව, අවුරුදු 14- 30 අතර වයස් සීමාවේ පසුවන බුද්ධිමය දුබලතා සහිත ළමුන්ගේ ජීවන කුසලතා සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුව සඳහා පූර්ව සූදානම් කිරීම වෙනුවෙන් පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානයක් කොට්ටාව ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. පුහුණුව අවසානයේ කුසලතා තක්සේරුවක් හා ප්‍රගති සමාලෝචනයකින් අනතුරුව වෘත්තීය පුහුණු ආයතනයන් වෙත යොමු කිරීම හෝ නිවෙස් මට්ටමින් සමාජ අන්තර්කරණය සිදුකිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලැබේ.

එසේම, මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන, දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කොට ඇති තවත් එක් වැඩසටහනකි. ඒ යටතේ මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීමේ ආයතනයක් අවිස්සාවේල්ල පුවක්පිටිය ප්‍රදේශයේ ස්ථාපිත කොට තිබේ. මීට අමතරව

ප්‍රාදේශීය මට්ටමින් ජනතාව සහ පාසල් සිසුන් දැනුවත් කිරීම වෙනුවෙන් ප්‍රජා මත් නිවාරණ වැඩසටහන් සහ පෞරුෂ සංවර්ධන වැඩසටහන් පැවැත්වීමත් හරහා රටේ අනාගත පරපුර මතින් මුදවා ගැනීම වෙනුවෙන් සුවිශාල සේවාවක් සපයයි.

ආබාධ සහිත වූවන්ගේ සෞන්දර්ය කුසලතාවයන් එළි දක්වමින් ඔවුන් ජාතික මට්ටමට ගෙන ඒම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ආබාධ සහිත වූවන්ගේ ජාතික සංස්කෘතික ප්‍රසංගය "සිත්රූ" ජාතික කලා ප්‍රසංගය, දෘෂ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් "ජාත්‍යන්තර සුදුසැරයටි දින සැමරුම් උළෙල" බිහිරි ප්‍රජාව වෙනුවෙන් "ජාත්‍යන්තර සංඥා භාෂා දින සැමරුම් උළෙල" සහ ආබාධ සහිත වූවන්ගේ ක්‍රීඩා හැකියාවන් ජාත්‍යන්තර තලයට ගෙන යාම වෙනුවෙන් ජාතික මළල ක්‍රීඩා උත්සවයන් පැවැත්වීම, ආබාධ සහිත ප්‍රජාව ජාතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සමාජ සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් සිදුකරන සුවිශේෂී වැඩසටහන් වේ.

එසේම වෘත්තීය පුහුණු අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන්, කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදතාව, අවබෝධය හා විශ්වසනීයත්වය වර්ධනය කිරීම වෙනුවෙන් ආබාධ සහිත ළමුන්ගේ බක්මහ උළෙල ආයතන මට්ටමින් පැවැත්වේ. එසේම සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතනයන් අතර පොසොන් පෙහොය නිමිති කරගත් "පොසොන් උදාවයි දහම් උදාවයි" තේමාව කරගත් පොසොන් බැති ගී සරණියක්, චිත්‍ර, සහ පොසොන් කූඩු නිර්මාණ තරඟයක් පවත්වීම තුළින් එම සේවා ලාභීන්ගේ දරුවන්ගේ කලාත්මක නිර්මාණ කුසලතාවය හා ගායන හැකියාව ඇගයීමට ලක් කිරීමද වාර්ෂිකව සිදුකරනු ලැබේ.

එසේම දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අනුගත වෙමින් සියලුම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීමට දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනවලට අනුයුක්ත නිලධාරීන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායිතාව හා අධ්‍යාත්මික සංවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු, වැඩමුළු, සම්මන්ත්‍රණ හා පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම ද සිදු කරනු ලබයි.

දිවයින පුරා විසිරී සිටින ආබාධ සහිත ප්‍රජාවගේ නිර්මාණ වලට ජාතික මට්ටමේ වෙළඳ පොළක් නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරිව සංවිධානය කරන ලද "දිරිය නිපැයුම් වෙළඳ ප්‍රදර්ශණය" රට තුළ ඇතිවූ දිට්වා හදිසි සුළි කුණාටු තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වුවත්, ආයතනවල අභ්‍යාසලාභීන් විසින් සිදුකරන ලද නිර්මාණ ඒකරාශී කරමින් " දිරිය පොළ " සෙත්සිරිපාය පරිශ්‍රය තුළ සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබිණි.

2025 වසර තුළ සිදුකරනු ලැබූ සියලු වැඩසටහන්, ව්‍යාපෘති තුළින් ඉහළ කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකියාව ලැබුණු අතර, ඒ සම්බන්ධ තොරතුරු හා වැය ශීර්ෂ 216 යටතේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය මේ තුළ අන්තර්ගත වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ආන්තිකරණයට හා අවාසි සහගත තත්වයට පත් වූ සෑම තැනැත්තෙකුම සුරක්ෂිත හා අන්තර්කරණීය සමාජයක අභිමානයෙන් යුතුව ජීවත්වීම සඳහා සවිබල ගැන්වීම

### මෙහෙවර

"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තියවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම"

### අරමුණු

- ආබාධ සහිත තැනැත්තන් ඇතුළු අනෙකුත් ආන්තීකරණයට හා අවාසි සහගත තත්වයට පත් වරප්‍රසාද නොලත් ප්‍රජාවගේ සමාන අයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජ ආරක්ෂාව තහවුරු කිරීම.


- ආබාධ සහිත තැනැත්තන් සඳහා ආදායම් උත්පාදනයට ප්‍රවේශ සැපයීම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යන්

- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන තුළින් ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම.
- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොලට සරිලන පරිදි සංවර්ධනය කිරීම.
- ආබාධ සහිත ළමුන් සඳහා කල්තියා මැදිහත්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- දෙමාපිය, භාරකරුවන් අහිමි විවිධ ආබාධ සහිත පුද්ගලයින් සඳහා පූර්ණ කාලීන නේවාසික රැකවරණය සැපයීම හා සවිබල ගැන්වීම
- ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධන වැඩසටහන (CBR) යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා සැපයීම හා ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූලාධාර සැපයීම.
- වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා වෛද්‍යාධාර සැපයීම, ක්‍රීඩා ,අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම, සහ යටිතල පහසුකම් සැපයීම හා අනෙකුත් සුභසාධන කටයුතු ඉටු කිරීම.
- අයාල ආඥා පනතට අනුව උසාවි නියෝගයන් මත යොමු කර ඇති සේවාලාභීන් අතුරින් යම් ප්‍රමාණයක් හෝ සමාජගත කර ඔවුන් ජාතික ශ්‍රම බලකායේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සමාජ ගැටලු හඳුනා ගැනීම වෙනුවෙන් පර්යේෂණ ඒකකයක් ආරම්භ කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අදාළ කටයුතු ආරම්භ කිරීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු, සම්මන්ත්‍රණ වැඩසටහන් හා වැඩමුළු සඳහා යොමු කිරීම.

## 1.4 සංවිධාන සටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



## 1.5 සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා ආයතන

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පවතින අංශ**

- පාලන අංශය
- සංඥා භාෂා අංශය
- සේවා අංශය
- ප්‍රජා මූලික පුනරුත්ථාපන අංශය (සී.බී.ආර්)
- සංවර්ධන අංශය
- මූල්‍ය හා ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- පර්යේෂණ හා මාධ්‍ය අංශය

**සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන**

- **වෘත්තීය පුහුණු ආයතන**
  - කැටවල වෘත්තීය පුහුණු ආයතනය
  - වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය
  - අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය
  - මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය
  - සීදූව වෘත්තීය පුහුණු ආයතනය
  - කලවාන වෘත්තීය පුහුණු ආයතනය
  - තෙලඹියාය වෘත්තීය පුහුණු ආයතනය
  - රාගම වෘත්තීය පුහුණු ආයතනය
  - මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය
  - කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය
  - තෝලංගමුව අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය
- **ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන**
  - නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය
  - සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය
- **පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය- කොච්චාව**
- **රැකවරණ මධ්‍යස්ථාන**
  - ජයවිරු  සෙවණ රැකවරණ මධ්‍යස්ථානය
  - මනුසත් පියස කාන්තා රැකවරණ මධ්‍යස්ථානය
- **ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය**
- **රිදියගම කළණ නිවර්තන නිවාසය**

### 1.5.1.1 පාලන අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායිවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

එහිදී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදුකිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමටත් අදාළව පාලන අංශය මඟින් කාර්යයන් සිදුකරනු ලබයි. මීට අමතරව දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒ සම්බන්ධයෙන් පවතින ගැටළු නිරවුල් කිරීම හා ඊට අදාළ උපලේඛණ පවත්වාගෙන යාම ආදි විවිධ කාර්යයභාරයන් සිදුකරනු ලබයි.

### 1.5.1.2 සංඥා භාෂා අංශය

පූර්ණ ශ්‍රවණ හා කථන ආබාධ සහිත පුද්ගලයින් සඳහා අනන්‍යතාවය තහවුරු කිරීමට හැඳුනුම්පතක් ලබාදීමත්, පූර්ණ හා අර්ධ ශ්‍රව්‍යාබාධිත හා කථන ආබාධ සහිත පුදුගලයින් සඳහා අධ්‍යාපනික, සමාජයීය, සංස්කෘතික සේවාවන් ලබා ගැනීමේදී මෙන්ම සෞඛ්‍ය හා නෛතික පහසුකම් ලබා ගැනීමේදී සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම සංඥා භාෂා පරිවර්ථක නිලධාරීන් 10 දෙනෙකු සේවය කරන අතර, ඉන් නිලධාරීන් හයදෙනෙකු වෘත්තීය පුහුණු ආයතන වල ද අනෙක් නිලධාරීන් සිව්දෙනා ප්‍රධාන කාර්යාලයේ සංඥා භාෂා අංශයේ ද සේවය කරනු ලබයි. එසේම ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ගේ සන්නිවේදනය පහසුකිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතන, ජනමාධ්‍ය ආයතන සඳහා අවශ්‍ය සහාය ලබා දීම මෙම නිලධාරීන් මඟින් සිදුකෙරේ.

### 1.5.1.3 ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) අංශය

සී.බී.ආර් අංශය මඟින් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. නිවෙස් මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම, සමාජ ගත කිරීම හා සේවා සැපයීම මෙම වැඩසටහන තුළින් සිදුකරනු ලැබේ.

එහිදී ආබාධ සහිත පුද්ගලයන් හඳුනාගෙන එක් එක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා පුනරුත්ථාපන සැලසුම් සකස් කිරීම, ඊට අදාළව ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීම, සමාජ ගතකිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම, සහ ඔහු සාමාන්‍ය පුද්ගලයෙකු ලෙස ප්‍රධාන ප්‍රවාහයට එකතු කිරීමට ප්‍රයත්න දැරීම මෙමඟින් සිදුකෙරේ. එහිදි ඔවුන්ට අවශ්‍ය සේවා හා අවස්ථා සම්පාදනය සඳහා ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක වන වැඩපිළිවෙලක් පවතී. මීට අමතරව, ආර්ථික හා සමාජීය බල ගැන්වීම, ස්වශක්ති සංවිධාන නමින් ආබාධිත සංවිධානගත කිරීම හා සංවිධාන කිරීම, හා ජාතික මට්යමින් ඇගයීමට ලක් කිරීම සිදුකෙරේ.

### 1.5.1.4 සේවා අංශය

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින ආන්තික කරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් පුද්ගලයන් රාජ්‍ය අනුග්‍රහය යටතේ සවිබල ගන්වා අභිමානවත් පුරවැසියන් ලෙස ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරලීම අරමුණු කර ගනිමින් සේවා අංශය ක්‍රියාත්මක වේ. එහිදි පහත සඳහන් කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

- අවුරුදු 16 -35 වයසේ පසුවන ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම,
- ආබාධ සහිත දරුවන්ගේ පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධනය තුලින් වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම.
- වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් රැකියාගත (ස්වයංරැකියා හා ආයතනගත)කිරීම හා ඒ පිළිබඳ පසුවිපරම් සිදු කිරීම.
- ආබාධ සහිත දරුවන් පෙර පාසල් අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපනය දක්වා සංවර්ධනය කිරීමට අදාළව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හරහා සේවා සැපයීම.
- මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා මත්ලෝලී පුනරුත්ථාපන ආයතනය මඟින් මත්ලෝලීන් පුනරුත්ථාපනය හා සමාජගත කිරීමට අදාළ සේවා සැපයීම.
- ආබාධ සහිත දරුවන් සඳහා ක්‍රියාත්මක වන විශේෂ අධ්‍යාපන ඒකක /රාජ්‍ය නොවන පෙර පාසල්වල ගුරුවරුන්ගේ සේවා ඇගයීම හා අභිප්‍රේරණය සඳහා දීමනා ලබා දීම.
- දෙමව්පියන්/භාරකරුවන් අහිමි ආබාධ සහිත බුද්ධි ඌනතා සහිත පිරිමි/ කාන්තා රැකවරණ මධ්‍යස්ථානයන් හරහා අවශ්‍ය රැකවරණ සේවා සැපයීම.
- අයාල ආඥා පනත අනුව වැරදිකරුවන් වන පුද්ගලයින් සඳහා නිවර්තන නිවාස පනතට අනුව රැකවරණය ලබාදීම, සවිබලගැන්වීම හා සමාජ ගත කිරීම තුලින් යහපත් ජීවන තත්වයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සේවා සැපයීම.
- ආබාධ සහිත ප්‍රජාව සඳහා ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන සඳහා නඩත්තු ආධාර ලබාදෙමින් එම ආයතන සිදු කරනු ලබන සමාජ මෙහෙවරට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.

### 1.5.1.5 සංවර්ධන අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමස්ත ක්‍රියාකාරිත්වයට ඍජුවම බලපානු ලබන කාර්යභාරයන් රාශියක් සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබයි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා සකස් කිරීම මෙන්ම නිලධාරීන්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමට සමගාමීව සිදුකරනු ලබන පුහුණුවීම්, දැනුම් යාවත්කාලීන කිරීම, ඵලදායිතාවයන් සංවර්ධනය කිරීම ආදිය මුල් තැනක් ගනු ලබයි. මීට අමතරව දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අදාල කටයුතු සිදුකරනු ලබයි. එසේම ජාතික වැඩසටහන් සංවිධානය, රාජ්‍ය නොවන ආයතන

සම්බන්ධීකරණය හා මෙහෙයවීම, විවිධ ව්‍යාපෘතීන්, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආදි කාර්යයභාරයන් සිදුකරනු ලබයි.

### 1.5.1.6 මූල්‍ය හා ගිණුම් අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, දෙපාර්තමේන්තු ගිණුම් පවත්වා ගනිමින් විනිවිද භාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම මූල්‍ය හා ගිණුම් අංශය මඟින් ඉටු කරන ප්‍රධාන කාර්යභාරය වේ.

මෙහි ප්‍රධාන ගණකාධිකාරවරයාගේ මඟපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙය වීම මඟින් මූල්‍ය හා ගිණුම් කටයුතු සිදුවන අතර මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මඟින් ලබාදී ඇති බලතල අනුව සියලුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම, කළමනාකරණය හා ගිණුම් තැබීම සිදුකරනු ලබයි.

### 1.5.1.7 අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38වන වගන්තියේ දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම ඉටුවන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති පත් කිරීම හා මු.රෙ 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ නියමයන් පරිදි විගණන කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### 1.5.1.8 පර්යේෂණ හා මාධ්‍ය අංශය

සමාජ සේවා දෙපාර්තමේන්තු මෙහෙවරට අනුව යමින් පවතින සමාජ ගැටලු පිළිබඳව පර්යේෂණාත්මකව අධ්‍යනය කර ඒ වෙනුවෙන් සුදුසු විසඳුම් යෝජනා සහ සැළසුම් සකස් කිරීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වයක් ලබා දීමේ අරමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පර්යේෂණ කණ්ඩායමක් ස්ථාපිත කර තිබේ. ඒ සඳහා දිස්ත්‍රික්කයන් 25 ආවරණය පරිදි සමාජ සේවා නිලධාරීන් 25 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් මේ වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

මීට අමතරව, ප්‍රජා මත් නිවාරණය වෙනුවෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් වැඩසටහන් සංවිධානය සහ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු, හා සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් හා ජාතික උත්සව වලට අදාළ මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ආවරණයට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

### 1.5.1.9 දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම

ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අනුව **" එක්ව අත්නොහැර"** සංකල්පය යටතේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකර සමාජ අන්තර්කරණයට අවස්ථාව ලබාදීමේ අරමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි .

එහිදී ලක්ෂ 9කට ආසන්න විවිධ ආබාධ සහිත ප්‍රජාව (2024 ජන හා නිවාස සංගණනය) අතරින් ආබාධ සහිත දරුවන් සිටින දෙමාපියන් හට සුදුසු රැකියාවක නිරත වීමේ අවස්ථාව අහිමිව යාමත් ආබාධ සහිත දරුවන් පූර්ණ කාලීනව රැකබලා ගැනීමට සිදු වීමත් නිසා එම දෙමාපියන් මානසික වශයෙන් පීඩාවට පත්ව තිබේ. ඔවුන්ට මානසික සහනයක් වන පරිදි හා ඔවුන් ආර්ථික කටයුත්තක නිරත කරවමින් ශ්‍රම බලකායේ කොටස් කරුවන් කිරීමේ අරමුණින් ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් යටතේ දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අදාළ කටයුතු ආරම්භ කර තිබේ.

ඒ අනුව 2025 වර්ෂයේදී ගාල්ල, මාතර, හම්බන්තොට, කලුතර, ත්‍රිකුණාමලය, කෑගල්ල, අනුරාධපුර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් 8ක් තුල යොජිත කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබේ.

## 1.5.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

### 1.5.2.1 වෘත්තීය පුහුණු ආයතන

ආබාධ සහිත තරුණ තරුණියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරලමින් ගෞරවනීය ලෙස සමාජය තුළ නැගිසිටීමට ඉඩ ප්‍රස්ථා සපයා දෙමින් ඔවුන් ජාතික ශ්‍රම බලකායේ සක්‍රිය කොටස්කරුවන් කිරීම වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන 11ක් තුලින් අවස්ථාව සලසා දී තිබේ.

එහිදී ආබාධ සහිත තරුණ තරුණියන් තම නිවසට, ප්‍රජාවට වැඩදායක පුරවැසියන් සේ සමාජයේ ස්වාධීනව කටයුතු කිරිමට අවශ්‍ය දැනුම, පුහුණුව හා ආකල්ප සංවර්ධනය කරනු වස් වයස අවුරුදු 18.ත් 35ත් අතර ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම සිදුකෙරේ. වෘත්තීය පුහුණුව සඳහා පැමිණෙන සේවා ලාභීන් වෙනුවෙන් ආහාරපාන, නිල ඇඳුම් සහ සේවාලාභී දීමනාවක්ද මේ යටතේ නොමිලේ ලබාදෙනු ලැබේ.

## වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා

| අනු අං | වෘත්තීය පුහුණු ආයතනය | පවත්වනු ලබන පාඨමාලා | පාඨමාලා කාලය | ආයතනයේ ධාරිතාවය | බඳවා ගන්නා අභ්‍යාසලාභීන් |
|---|---|---|---|---|---|
| 1 | අමුණුකුඹුර | ටේලරින් ශිල්පය | අවුරුදු 01 | 100 | ගැ/පි |
| | | කෘෂි කාර්මික ශිල්පය | අවුරුදු 02 | | |
| | | සිමෙන්ති ආශ්‍රිත නිර්මාණ ශිල්පය | අවුරුදු 02 | | |
| | | සත්කාරක ශිල්පය | අවුරුදු 01 | | |
| | | ග්‍රැෆික් නිර්මාණ ශිල්පය | අවුරුදු 02 | | |
| | | බේකරි ශිල්පය/ ආහාර තාක්ෂණය | අවුරුදු 01 | | |
| 2 | වක්තේගම | රූපවාහිනී හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | 100 | ගැ/පි |
| | | වඩු කාර්මික ශිල්පය | අවුරුදු 02 | | |
| | | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | | |
| | | ටේලරින් ශිල්පය | අවුරුදු 01 | | |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| | | අත්කම් ශිල්පය | අවුරුදු 01 | | |
| | | බතික් නිර්මාණ ශිල්පය | අවුරුදු 01 | | |
| | | රූපලාවන්‍ය ශිල්පය | අවුරුදු 02 | | |
| | | **කෘෂි කාර්මික ශිල්පය - සියළුම අභ්‍යාසලාභීන් සඳහා පොදු පාඨමාලාවකි** | | | |
| 3 | කැටවල | වඩු කාර්මික ශිල්පය | අවුරුදු 02 | 50 | පි |
| | | මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පය | අවුරුදු 02 | | |
| | | මෝටර් රථ සින්තාරු ශිල්පය | අවුරුදු 02 | | |
| | | පැස්සුම් ශිල්පය | අවුරුදු 02 | | |
| | | මෝටර් රථ කාර්මික ශිල්පය | අවුරුදු 02 | | |
| | | යන්ත්‍ර ශිල්පය | අවුරුදු 02 | | |
| | | **කෘෂි කාර්මික ශිල්පය - සියළුම අභ්‍යාසලාභීන් සඳහා පොදු පාඨමාලාවකි** | | | |
| 4 | තෙළඹුයාය | රූපවාහිනී හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | | |
| | | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | | |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| | | හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු) | අවුරුදු 01 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | කෘෂි කාර්මික ශිල්පය | අවුරුදු 02 | 100 | ගැ/පි |
| | | ගෘහස්ථ විදුලි පරිපථ ශිල්පය | අවුරුදු 02 | | |
| | | බේකරි ශිල්පය/ ආහාර තාක්ෂණය | අවුරුදු 01 | | |
| | | වෙළඳ සහායක | අවුරුදු 01 | | |
| 5 | සීදූව | රූපවාහිනි හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | 130 | ගැ/පි |
| | | ශීතකරණ හා වායු සමීකරණ අලුත්වැඩියාව | අවුරුදු 02 | | |
| | | මහන යන්ත්‍ර ක්‍රියා කරවීම (කර්මාන්ත ශාලා - ජූකි) | අවුරුදු 01 | | |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| | | වඩු කාර්මික ශිල්පය | අවුරුදු 02 | | |
| | | හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු) | අවුරුදු 01 | | |
| | | ගෘහස්ථ විදුලි පරිපථ ශිල්පය | අවුරුදු 02 | | |
| | | නිල තෙරපුම් ශිල්පය | අවුරුදු 01 | | |
| | | ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | | |
| 6 | මාදම්පේ | මහන යන්ත්‍ර ක්‍රියා කරවීම (කර්මාන්ත ශාලා - ජූකි) | අවුරුදු 01 | 40 | ගැ/පි |
| | | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | | |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| | | හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු) | අවුරුදු 01 | | |
| 7 | රාගම | රූපවාහිනි හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | 24 | ගැ/පි |
| | | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | | |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| 8 | කලවාන | කෘෂි කාර්මික ශිල්පය | අවුරුදු 01 | 30 | පි |
| | | හස්ත කර්මාන්ත ශිල්පය (පොල්) | අවුරුදු 01 | | |
| 9 | මඩකලපුව | රූපවාහිනි හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කිරීම | අවුරුදු 02 | 50 | ගැ/පි |
| | | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | | |
| 10 | කිලිනොච්චිය | ඇඳුම් මැසීමේ ශිල්පය | අවුරුදු 02 | 50 | ගැ/පි |
| | | තොරතුරු තාක්ෂණය | අවුරුදු 02 | | |
| 11 | තෝලංගමුව | ඔනික් නිර්මාණ ශිල්පය | අවුරුදු 01 | 20 | ගැ/පි |
| | | **හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු) - සියළුම අභ්‍යාසලාභීන් සඳහා පොදු පාඨමාලාවකි** | | | |

- **රාගම වෘත්තීය පුහුණු ආයතනයේ පාඨමාලා කාලය මාස 06 සිට අවුරුදු 01 දක්වා වෙනස් විය හැකිය.**

### 1.5.2.2 ජයවිරු සෙවණ රැකවරණ නිවහන

කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති ජයවිරු සෙවණ ආයතනය මඟින් දෙමාපිය රැකවරණය අහිමි විවිධ ආබාධ තත්වයන්ගෙන් පෙළෙන විවිධ වයස් මට්ටම්වල පිරිමි පුද්ගලයින් සඳහා රැකවරණය සැපයීම සිදුකෙරේ.

මුළු ජීවිත කාලය පුරාම නේවාසිකව සිටින මෙම පිරිස හුදකලා නොකොට ආදරයෙන්, සෙනෙහසින් රැකබලා ගන්නා අතරම, දෛනික ක්‍රියාකාරකම් සඳහා ද යොමු කෙරේ. නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම ද සිදුකෙරේ.

### 1.5.2.3 මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය

රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය, දෙමාපියන් සහ භාරකරුවන් අහිමි වයස අවුරුදු 16-59 අතර වයසේ පසුවන ආබාධ සහිත කාන්තාවන්ට රැකවරණය ලබාදීමේ අරමුණින් පිහිටුවා ඇත. රැකවණය ලබන කාලසීමාව තුළ නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම ද සිදුකෙරේ.

### 1.5.2.4 රිදියගම කළණ නිවර්තන නිවහන

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටුවා ඇති රිදියගම කළණ නිවර්තන නිවාසය අයාල ආඥා පනතට අනුව අධිකරණයන් මඟින් වැරැදිකරුවන් වන පුද්ගලයින් සඳහා නිවර්තන නිවාස පනත යටතේ රැකවරණය ලබාදෙනු ලබන මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක එකම ආයතනය වේ. මෙම ආයතනය තුළින් සේවාලාභීන් 500 කට ආසන්න ප්‍රමාණයක් සඳහා රැකවරණය සලසනු ලබයි.

රැකවරණය ලබන බහුතර පිරිස ජීවනෝපාය ලෙස සිඟමන් යැදීම, සහ සුළු රැකියාවන් වල නිරත වූ ඇතැම් පුද්ගලයින් නගරයේ ප්‍රසිද්ධ ස්ථාන වල ජීවත් වීම නිසා අත්අඩංගුවට පත්වී අධිකරණ නියෝගයන් මත මෙම ආයතනය වෙත යොමුකර තිබේ. එසේම මෙම රැඳවියන් අතුරින් කාන්තාවන් 60% ක පමණ පිරිස ජීවනෝපාය ලෙස ගණිකා වෘත්තියේ නියැලීම, වයස්ගත වීම හා නොයෙකුත් ලෙඩ රෝග (සමාජ රෝග) වැළඳීම නිසා සිඟමන් යැදීමට යොමු වීම හේතුවෙන් අධිකරණ නියෝගයන් මඟින් යොමු කර සිටින පිරිස් වේ.

මෙම සේවාලාභීන් අතුරින් යම් ප්‍රමාණයක් හෝ ජාතික ශ්‍රම බලකායේ සක්‍රිය කොටස් කරුවන් බවට පත්කිරීම වෙනුවෙන් දැනුම, කුසලතා ,ආකල්ප සංවර්ධනය, වෘත්තීය පුහුණුව ලබාදීමත් සිදුකෙරේ. එසේම මෙම සේවාලාභීන් අතුරින් සුදුසු සේවාලාභීන් සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යන සිදුකර, සත්කාරක

සැලසුම් සකස් කොට සේවාලභීන් යම් ප්‍රමාණයක් හෝ සමාජගත කිරීම වෙනුවෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් මේවනවිටත් ක්‍රියාත්මක කෙරේ.

### 1.5.2.5 ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය

කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය උතුරු අම්බලන්වත්ත ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය මඟින් මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම වෙනුවෙන් කටයුතු කරනු ලබයි.

මෙම ආයතනය සඳහා යොමු වන සේවාලාභීන් , අධිකරණ නියෝග මඟින්, ස්වෙච්ඡාවෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෝහල් මඟින් යොමු කරනු ලබන සේවාලාභීන් වේ. සේවාලාභීන් 70කට ආසන්න ප්‍රමාණයක් පුනරුත්ථාපනයට යොමු කළ හැකි අතර, පුනරුත්ථාපන කාලය මාස 06 ක් වේ. අධිකරණ නියෝග මත යොමු කෙරෙන සේවාලාභීන්ගේ පුනරුත්ථාපන කාලය තීරණය කෙරෙනුයේ අධිකරණ නියෝගය ප්‍රකාරවය.

සැබෑ ජීවන දර්ශනය හා ජිවිතයේ සැබෑ සතුට අවබෝධය තුළින් හැකියාවන් ඔප් නැංවීම තුළින් මතට ඇති නැඹියාව අවම කර මතට ඇබ්බැහි වූ පුද්ගලයින් පුනරුත්ථාපනය තුළින් ජාතික සංවර්ධනයට දායක කරවීම මෙම ආයතනය මඟින් අපේක්ෂා කෙරේ.

### 1.5.2.6 ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ දරුවකුගේ වර්ධනයේ කිසියම් ගැටළුවක් හෝ ප්‍රමාදයක් ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම අරමුණු කර ගනිමින් ළමා මාර්ගෝපදෙශන මධ්‍යස්ථාන දෙක (02) ක් ක්‍රියාත්මක කෙරේ.

නිවැරදි මාර්ගෝපදේශයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ආයතනයට පැමිණෙන දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන වර්ධන තත්ත්වයේ නිවැරදි තක්සේරුවක් සහතික කරවා ගැනීමෙන් අනතුරුව දරුවාගේ සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන්ට අදාළව ඍජු හා වක්‍ර මැදිහත්වීම් සිදුකරනු ලබන අතර, දෙමාපියන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා ලබාදීම ද සිදුකෙරේ. සේවා සපයනු ලබන ළමුන් මැනවින් සංවර්ධනය වූ පසු විශේෂ පාසල් වලට, විශේෂ අධ්‍යාපන ඒකකවලට හා සාමාන්‍ය පාසල් වලට අන්තර්කරණය කරනු ලබයි.

- **නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නාවින්න, පතිරගොඩ ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති මෙම ආයතනය මඟින් වයස මාස 06 සිට අවුරුදු 16 දක්වා දරුවන් 100 කට ආසන්න ප්‍රමාණයක් සඳහා වාර්ෂිකව සේවාවන් සපයනු ලැබේ.

- **සිතිජය ළමා මාර්ගෝපදේශන හා පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ, ඕලුවිල පාර, මල්පෙත්තාව ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් වයස මාස 06 සිට අවුරුදු 16 දක්වා දරුවන් සඳහා මාර්ගෝපදේශනය සපයනු ලබන අතර, අවුරුදු 14 -30 දක්වා වයසේ පසුවන ආබාධ සහිත යෞවන යෞවනියන් සඳහා පූර්ව කුසලතා සංවර්ධන වැඩසටහන්ද ක්‍රියාත්මක වේ.

### 1.5.2.7 පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය කොට්ටාව

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය වයස අවුරුදු 14-30ත් අතර වයසේ පසුවන ආබාධ සහිත යෞවන යෞවනියන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කරවීමට අවශ්‍ය පූර්ව සූදානම් කිරීම අරමුණු කරගනිමින් ආරම්භ කරන ලද ආයතනයකි.

මූලික තක්සේරුවකින් අනතුරුව තෝරාගනු ලබන සේවාලාභීන් වසර තුනක් තුළ අවශ්‍ය කුසලතා සංවර්ධනය කර සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෘත්තීය පුහුණු ආයතනයන්ට සහ වෙනත් ආයතන මඟින් ක්‍රියාත්මක වන ආයතන වෙත යොමු කරන අතර, වෘත්තීය පුහුණුවට යොමු නොවන ළමුන් දෛනික ජීවන කුසලතා සංවර්ධනය කර සාර්ථක පුද්ගලයෙකු ලෙස සමාජගත කරනු ලබයි.

## 1.6 සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

### 1.6.1 දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කොට තිබේ.

මෙම පනතට අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් ක්‍රියාත්මක කරමින් සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් හරහා පාලනය වන මෙම අරමුදල සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබයි. අරමුදල මඟින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

i. දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණු ලබාදීම.
ii. දෘශ්‍යාබාධිත සංවිධාන සඳහා ක්‍රීඩා ආධාර ලබාදීම.
iii. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබාදීම.
iv. පුනරුත්ථාපන ආධාර ලබාදීම.
v. අක්ෂි කාච සහ අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබාදීම.
vi. ජාත්‍යන්තර සුදු සැරයටි සැමරුම් දින ජාතික වැඩසටහන පැවැත්වීම.

## 1.7 විදේශ තාක්ෂණික ආධාර ලබන ව්‍යාපෘති, රාජ්‍ය නොවන සංවිධානවල අනුග්‍රහයන් මඟින් සිදුකරන ලද වැඩසටහන්

### 1.7.1 විදේශ තාක්ෂණික ආධාර ලබන ව්‍යාපෘති

- ව්‍යාපෘතියේ නම : Project for Promoting Employment Support of Persons with Disabilities in Sri Lanka (ESPD)
- දායක නියෝජිත ආයතනය : ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පදනම (JICA) තාක්ෂණික දැනුම පමණක් ලබාදීම.
- ව්‍යාපෘති කාලය:- අවු 4 (2021 නොවැම්බර් - 2025 නොවැම්බර්)

ආබාධ සහිත පුද්ගලයන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිය ඉහළ නැංවීම මූලික අරමුණ කර ගනිමින් රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) හා සමාජසේවා දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.

ඒ අනුව මෙම ව්‍යාපෘති කාලය 2025 වර්ෂයේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ අතර, එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව හා ගිවිසුම්ගතව රැකියා ප්‍රවර්ධන ඒකකයක් ලෙස **(ESU)** නව මුහුණුවරකින් ක්‍රියාත්මක කරනු ලබයි.

### 1.7.2 රාජ්‍ය නොවන සංවිධාන වල අනුග්‍රහයන් මගින් සිදුකරන ලද වැඩසටහන්

- **ChildFund** ආයතනය -

- ස්වෙච්ඡා පදනමින් බඳවා ගන්නා ලද වෘත්තීය උපදේශකවරුන් 8 දෙනෙකු සඳහා රු.40,000.00 බැගින් මාසික දීමනා ලබාදීම.
- ආබාධ සහිත වූවන්ගේ ජාතික මළල ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම

- **ILO** ආයතනය

- ඇඟලුම් ක්ෂේත්‍රය තුළ රැකියා අවස්ථා පුළුල් කිරීම වෙනුවෙන් අමුණුකුඹුර, තෙලඹුයාය සහ සීදූව වෘත්තීය පුහුණු ආයතනයන් තෝරා ගැනීම.
- ඇඟලුම් ක්ෂේත්‍රයට අදාළව පුහුණු මොඩියුලයක් සකස් කිරීම.

- **Gama Pizza Craft** ආයතනය

- අමුණුකුඹුර, තෙලඹුයාය හා සීදූව වෘත්තීය පුහුණු ආයතන තුළ Pizza Hutආයතනයේ අනුග්‍රාහකත්වයෙන් ස්ථාපිත කරන ලද ආහාර තාක්ෂණ ඒකක වල පුහුණුව ලැබූ ආබාධ සහිත තරුණ තරුණියන් පුහුණුව අවසානයේ සුදුසුකම් අනුව Pizza Hutආයතනයේ රැකියා සඳහාබඳවා ගැනීම.

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 2.1. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධානතම වැඩසටහන වන්නේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහනයි. දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් මෙම වැඩසටහන මඟින් අපේක්ෂිත අරමුණු සාධනයෙහිලා ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්, ව්‍යාපෘති හා උප ව්‍යාපෘති පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.


- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම තුළින් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම.
- මුල් ළමාවියේදීම ඇතිවන ආබාධ සහිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා චිකිත්සක සේවාවන් ඇතුළත් ළමා මාර්ගෝපදේශනය.
- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධනය.
- දෙමාපිය, භාරකරුවන් අහිමි ආබාධිත පුද්ගලයින් සඳහා රැකවරණය සැපයීම.
- සංඥා භාෂාව ප්‍රවර්ධනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන.
- දෘශ්‍යාබාධික පුනරුත්ථාපන භාර අරමුදල හරහා දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව පුනරුත්ථාපනය කිරීම.
- අයාල ආඥා පනත යටතේ අධිකරණයන් මඟින් වැරදිකරුවන් වන පුද්ගලයින් සඳහා රැකවරණය ලබාදීම හා සමාජගත කිරීම.
- ආබාධ සහිත දරු දැරියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 2.1.1 ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව ලබා දීම තුළින් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතම ව්‍යාපෘතිය වන්නේ ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තිය පුහුණුව ලබා දීමයි. දිවයින පුරා ව්‍යාප්තව පවතින වෘත්තිය පුහුණු ආයතන 11ක් හරහා වාර්ෂිකව ආබාධ සහිත තරුණ තරුණියන් 600 කට ආසන්න ප්‍රමාණයකට වෘත්තිය පුහුණුව ලබා දීම සිදු කරයි.

2025 අධ්‍යයන වසර සඳහා නව අභ්‍යාසලාභීන් බඳවා ගැනීම හා පාඨමාලා අරඹය 2025 ජනවාරි මස 20 වන දින සිදු කෙරුණු අතර, එම අධ්‍යයන වර්ෂයට අදාළ එක් අවුරුදු පාඨමාලා 2025 දෙසැම්බර් මස 19 වන දින අවසන් කරන ලදි.

**2025 වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**




2025 වර්ෂයේ වෘත්තිය පුහුණුව ලැබූ අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 496කි. අභ්‍යාසලාභීන් අතුරින් වෘත්තිය පුහුණුව සාර්ථක ලෙස නිම කල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 261කි. වෘත්තිය පුහුණුව සාර්ථකව නිම කල තරුණ තරුණියන් පෞද්ගලික අංශය තුළ රැකියා ගත කිරීමත්, එසේ රැකියා ගත නොවන සේවාලාභීන් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මෙවලම් කට්ටල ලබාදීම සිදුකෙරේ.

## 2.1.2 ළමා මාර්ගෝපදේශන වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 02ක් හරහා ළමා මාර්ගෝපදේශන හා චිකිත්සක සේවා ක්‍රියාත්මක කරනු ලබයි.

### 1. නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය

2025 වර්ෂයේ දී මාර්ගෝපදේශන සේවා සපයන ලද මුළු සේවාලාභීන් සංඛ්‍යාව 109ක් වූ අතර, ඉන් නවක සේවාලාභීන් ලෙස ලියාපදිංචි වූ සංඛ්‍යාව 46කි. මෙම සේවාලාභී දරුවන්ගෙන් අට දෙදෙනෙකු (8) සාමාන්‍ය පාසල් සඳහා ද එක් අයකු (1) පෙර පාසල් සඳහා ද යොමු කරවීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සපයා ඇත.

### 1.1 නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය මඟින් 2025 වර්ෂයේදී සිදුකරන ලද විශේෂ වැඩසටහන්

- සේවාලාභී දෙමාපියන් සඳහා සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ජංගම දන්ත වෛද්‍ය සායනයක් සඳහා දරුවන් යොමු කිරීම.
- සිත් - රූ ජාතික වැඩසටහන සඳහා දරුවන්ගේ නර්ථනාංගයක් ඉදිරිපත් කිරීම
- දරුවන්ගේ අත්කම් සහ නිර්මාණ ප්‍රදර්ශනයන් පැවැත්වීම. (නාවින්න ආයතන පරිශ්‍රය, සමාජ සේවා දෙපාර්තමේන්තු පරිශ්‍රය හා බස්නාහිර පලාත් මාර්ග සංවර්ධන අධිකාරි පරිශ්‍රය)
- විවිධ ආගමික සහ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම. (වෙසක්, පොසොන්, ඇසළ, බක්මහ උළෙල, නත්තල් උත්සව ආදි විවිධ වැඩසටහන් )

**නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**
**2025 වර්ෂයේ ලියාපදිංචි නවක සේවාලාභීන් ගණන - 46 ( පිරිමි ළමුන් 29 /ගැහැණු ළමුන් 17)**

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | මස්තිෂ්ක ආඝාතය | ඩවුන් සින්ඩ්‍රෝම් | වර්ධනය ප්‍රමාද | කථනාබාධ | අධි ක්‍රියාකාරී | ශ්‍රවණාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **0 – 03** | - | - | 01 | 01 | - | 01 | - | - | - | **03** |
| **03 – 05** | 04 | 01 | 04 | 05 | 01 | - | - | - | - | **15** |
| **05 - 15** | 11 | 02 | 03 | 09 | - | 02 | - | - | - | **27** |
| **15 - 18** | - | - | - | - | - | - | - | - | - | **-** |
| **18 ට වැඩි** | - | - | - | 01 | - | - | - | - | - | 01 |
| එකතුව | **15** | **03** | **08** | **16** | **01** | **03** | **-** | **-** | **-** | **46** |

### නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය
### 2025 වර්ෂයේ මුළු සේවාලාභීන් සංඛ්‍යාව - 109 ( පිරිමි 67 /ගැහැණු 42)

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම | මස්තිෂ්ක අංශභාගය | ඩවුන් සින්ඩ්‍රෝම | බුද්ධිමය දුබලතා | කථනාබාධ | අධි ක්‍රියාකාරී | ශ්‍රවණාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **0 - 03** | - | - | 01 | 02 | - | - | - | - | 01 | **04** |
| **03 - 05** | 03 | 03 | 04 | 04 | 01 | 02 | - | - | - | **17** |
| **05 - 15** | 17 | 08 | 21 | 16 | 03 | 03 | - | - | 02 | **70** |
| **15 - 18** | 04 | 01 | 02 | 03 | - | - | - | - | - | **10** |
| **18 ට වැඩි** | 01 | 04 | 02 | 01 | - | - | - | - | - | **08** |
| එකතුව | **25** | **16** | **30** | **26** | **04** | **05** | **-** | **-** | **03** | **109** |

### නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය
### එක් එක් අංශ මගින් ලබාදුන් සේවා පිළිබඳ විස්තර

| ලබා දුන් සේවය | ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|
| භෞත චිකිත්සක සේවා | 109 | 349 |
| කථන චිකිත්සක සේවා | | - |
| වෘත්තීය චිකිත්සක සේවා | | - |
| අධ්‍යාපන සේවා | | 5510 |
| දෛනික කටයුතු පුහුණු කිරීම | | 1321 |
| උපදේශන සේවා | | 83 |

## 2. හම්බන්තොට "සිහිජය" ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය

2025 වර්ෂයේ සේවා සපයන ලද මුළු සේවාලාභීන් සංඛ්‍යාව 87ක් වූ අතර, ඉන් නවක සේවාලාභීන් ලෙස ලියාපදිංචි වූ සංඛ්‍යාව 31කි. මෙම සේවා ලාභී දරුවන්ගෙන් සිව් දෙදෙනෙකු (04) සාමාන්‍ය පාසල් සඳහා ද සිව් දෙදෙනෙකු (04) වෘත්තීය පුහුණුව සඳහා ද යොමු කරවීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සපයා ඇත.

2.1 ආයතනය මගින් සපයන ලද සේවාවන් අතර,

- කථන චිකිත්සක, වෘත්තීය චිකිත්සක, භෞත චිකිත්සක සේවාවන් සැපයීම.
- සේවාලාභී දෙමාපියන්, සහ කාර්ය මණ්ඩලය සඳහා මානසික සුවතාවය වෙනුවෙන් උපදේශනය, අධ්‍යයන හා විනෝද චාරිකා.
- ආයුර්වේද සෞඛ්‍ය සායන පැවැත්වීම, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- Shelter Work Shop ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- විවිධ ආගමික සහ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම. (වෙසක්, පොසොන්, අවුරුදු උත්සව, ළමා දින උත්සව ආදි විවිධ වැඩසටහන් )

**සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**
**2025 වර්ෂයේ ලියාපදිංචි නවක සේවාලාභීන් ගණන - 31 ( පිරිමි 20 /ගැහැණු 11)**

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | මස්තිෂ්ක ආඝාතය | ඩවුන් සින්ඩ්‍රෝම් | වර්ධනය ඌනතා | ශ්‍රවණාබාධ | අධි ක්‍රියාකාරී | දෘශ්‍යාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **00-05** | 04 | - | 02 | 01 | - | - | - | - | - | **07** |
| **05-10** | 02 | - | 02 | - | - | 03 | | | 07 | **14** |
| **10-15** | 01 | - | 01 | - | - | 01 | - | - | 03 | **06** |
| **15-20** | - | - | - | 02 | - | - | - | - | 02 | 04 |
| එකතුව | **07** | **-** | **05** | **03** | **-** | **04** | **-** | **-** | **12** | **31** |

තවද, පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධනය සඳහා අවුරුදු 15 සිට 20 දක්වා වයසේ පසුවන යෞවන යෞවනියන් මෙම මධ්‍යස්ථානයේදී කුසලතා සංවර්ධනය කර වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

**සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය**
**2025 වර්ෂයේ මුළු සේවාලාභීන් සංඛ්‍යාව - 87 ( පිරිමි 54 /ගැහැණු 33)**

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | මස්තිෂ්ක ආඝාතය | ඩවුන් සින්ඩ්‍රෝම් | වර්ධනය ඌනතා | ශ්‍රවණාබාධ | අධි ක්‍රියාකාරී | දෘශ්‍යාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **00-05** | 04 | - | 02 | 01 | - | - | - | - | - | **07** |
| **05-10** | 05 | - | 05 | 01 | 01 | 05 | - | - | 15 | **32** |
| **10-15** | 03 | - | 01 | 02 | 01 | 06 | - | - | 14 | **27** |
| **15-20** | 02 | - | 01 | 03 | - | - | - | - | 15 | 21 |
| එකතුව | **14** | **-** | **09** | **07** | **02** | **11** | **-** | **-** | **44** | **87** |

### 2.1.3 පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන වැඩසටහන

අවුරුදු 14-30 වයස් කාණ්ඩයේ පසුවන යොවුන් විශේ ආබාධ සහිත දරුවන් වෘත්තීය පුහුණු ආයතනවලට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය පූර්ව සූදානම් කිරීම කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය හරහා සිදු කෙරේ.

2025 වර්ෂය තුළ ආබාධ සහිත ළමුන් 36ක් සඳහා අවැසි සේවා සපයා ඇති අතර, සේවාලාභීන් 11 දෙනෙකු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කර ඇති අතර, ඉන් 5 දෙනෙකු සාර්ථකව වෘත්තීය පුහුණු පාඨමාලාවන්හි නිරතව සිටී. මීට අමතරව, සේවාලාභීන් හතර දෙනෙකු වෘත්තීය පුහුණුව සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ද යොමු කිරීමට හැකි වී ඇත.

**කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය**
**2025 වර්ෂයේ සේවා සපයන ලද මුළු සේවාලාභීන් සංඛ්‍යාව - 36 ( පිරිමි 17 /ගැහැණු 19)**

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | ඩවුන් සින්ඩ්‍රෝම් | බුද්ධි ඌනතා | අධි ක්‍රියාකාරී | ස්නායු ආබාධ | මස්තිෂ්ක ආඝාතය | බහු ආබාධ | කථන හා ශ්‍රවණ | වෙනත් | |
| **14-20** | - | 06 | 05 | 01 | 02 | - | 01 | 01 | | **16** |
| **21-30** | - | 02 | 05 | 02 | 01 | 03 | - | 01 | 01 | **15** |
| **30ට වැඩි** | | 03 | 02 | | | | | | | **05** |
| **එකතුව** | **-** | **11** | **12** | **03** | **03** | **03** | **01** | **02** | **01** | **36** |

**කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය**
**සපයන ලද සේවාවන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | ක්‍රියාකාරකම් | උප ක්‍රියාකාරකම් |
|---|---|---|
| **01** | ස්වයං ආධාරක කුසලතා සංවර්ධනය | • ආහාර ගැනීම, ඇඳුම් ඇඳීම, ආහාර පිසීම, පෞරුෂත්ව සංවර්ධනය, වැසිකිලි භාවිතය, පෞද්ගලික ස්වස්ථතාවය, පොදු පරිසරයක හැසිරීම |
| **02** | පරිසර ක්‍රියාකාරකම් | • කෘෂි කර්මය(පැල වගාව), ශ්‍රමදාන, පරිසර අලංකරණය, මල්වගාව, නිරීක්ෂණ චාරිකා |
| **03** | තේමා පාදක සංකල්ප | • නිවැරදි අක්ෂර ලිවීම, වචන උච්ඡාරණය, විවිධ සංකල්ප අවබෝධය, සංඛ්‍යා අවබෝධය |
| **04** | තේමා පාදක ක්‍රියාකාරකම් | • තේමාවට අදාළව නිර්මාණ සැකසීමේ ක්‍රියාකාරකම් |

| | | |
|---|---|---|
| | | • වාලක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ අත්වැඩ ක්‍රියාකාරකම් |
| 05 | සමාජ කුසලතා | • සමානාත්මතා වර්ධනය, එකමුතුකම වර්ධනය, සන්නිවේදන කුසලතා වර්ධනය, සහකම්පනය හා හැඟීම් හඳුනා ගැනීම, ගමනාගමනය පිළිබඳ අවබෝධය, හදිසි අවස්ථා සඳහා සූදානම් කිරීමේ ක්‍රියාකාරකම් |
| 06 | පෞරුෂත්ව සංවර්ධනය | • නායකත්ව කුසලතා, ක්‍රීඩා කුසලතා වර්ධනය, ශරීර සුවතා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, මාසික සාහිත්‍ය සමිතිය පැවැත්වීම. |
| 07 | සෞන්දර්ය කුසලතා සංවර්ධනය | • ගායනය, වාදනය, නර්තනය, චිත්‍ර ඇඳීම, නාට්‍ය රංගනය |
| 08 | අධ්‍යාත්මික සංවර්ධනය | • සීල භාවනා වැඩසටහන්, වන්දනා චාරිකා |
| **09** | වෘත්තීය පුහුණු කුසලතා සංවර්ධනය | • පහන්තිර ඇඹරීම, පාපිසි, මල් පෝච්චි අලංකරණය, ඉටි පන්දම් සකස් කිරීම, අත්කම් නිර්මාණය, පොල්කටු ආශ්‍රිත නිර්මාණ |

### 2.1.4 ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීම වෙනුවෙන් දිවයින පුරා ක්‍රියාත්මක වන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන, විශේෂ අධ්‍යාපන ඒකක, සහ පුනරුත්ථාපන ආයතන 33ක් සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් දීමනා ලබා දීම සිදු කෙරේ.

ඒ අනුව 2025 වර්ෂයේදි ආයතනයේ ස්වභාවය, අවශ්‍යතාවය හා ඉල්ලීම මත අභ්‍යාසලාභී දීමනා, නඩත්තු දීමනා, සහභාගීත්ව දීමනා, ගුරු දීමනා, සංග්‍රහ දීමනා, ප්‍රවාහන දීමනා හා නේවාසික දීමනා ලබාදීමට කටයුතු කර ඇත.

| අනු අංකය | ස්වෙච්ඡා සංවිධානයන් | දීමනා ලබාදෙනු ලබන ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන | 15 |
| 2 | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන | 03 |
| 3 | විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථාන /ආයතන /පාසල් | 03 |
| 4 | පුනරුත්ථාපන මධ්‍යස්ථාන | 02 |
| 5 | වෙනත් (බිහිරි සේවා මණ්ඩලය/ ජාතික මානසික සභාව /ඒකක /ස්වර්ණදාම/ සංවර්ධන පදනම | 10 |
| | **එකතුව** | **33** |

## 2.1.5 දෙමාපියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පුද්ගලයන් සඳහා රැකවරණය ලබා දීමේ වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පුවක්පිටිය "ජයවීරු සෙවණ" රැකවරණ මධ්‍යස්ථානය මඟින් දෙමාපියන් සහ භාරකරුවන් අහිමි විවිධ වයස් මට්ටම් වල පසුවන බුද්ධි ඌණතා සහිත පිරිමි පුද්ගලයින් 80 කට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් ජීවිත කාලය පුරා රැකවරණය ලබා දීම සිදුකෙරේ.

2025 වර්ෂය ආරම්භයේදී සේවාලාභින් 80 ක සංඛ්‍යාවක් සඳහා රැකවරණය සපයමින් ආයතනය පවත්වාගෙන යනු ලැබූ අතර, 2025 වසර අවසානය වන විට මුළු සේවා ලාභීන් 89 දෙනෙකු සඳහා ආහාර, නවාතැන්, වෛද්‍ය හා සනීපාරක්ෂක පහසුකම් ලබා දෙමින් රැකවරණය සපයා ඇත.

විවෘත පාසල් වැඩසටහන යටතේ මෙම ආයතන වල සිටින මන්ද මානසික හා විවිධ ආබාධ සහිත දරුවන්ගේ චාලක හැකියාවන් සංවර්ධනය හා සාක්ෂරතාවය වර්ධනය සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකර ඇත. රැකවරණය ලැබූ සේවා ලාභීන්ගෙන් 72 දෙදෙනෙකුම මන්ද මානසික ආබාධ සහිත වූවන් වන අතර, 17 දෙනෙකු අනෙකුත් ආබාධ සහිත සේවාලාභින් විය. වයස් මට්ටම අනුව ආයතනයේ රැකවරණය ලැබූ පිරිසෙන් වැඩිම ප්‍රමාණයක් වයස අවුරුදු 31-40 අතර වයසේ පසුවන අතර, එය සංඛ්‍යාත්මකව ගත් කළ 23කි.

**පුවක්පිටිය "ජයවීරු සෙවණ" ආයතනය**
**සපයන ලද සේවාවන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | ක්‍රියාකාරකම් | උප ක්‍රියාකාරකම් |
|---|---|---|
| 01 | කායික සංවර්ධනය | - වෛද්‍ය සායන, (ආබාධ සහ වයස් මට්ටම් අනුව)ක්‍රීඩා වැඩසටහන් |
| 02 | මානසික සංවර්ධනය | - ආගමික වැඩසටහන්, (දානමය කටයුතු, ධර්ම දේශනා), රසවින්දනාත්මක වැඩසටහන් හා විවෘත පාසල් වැඩසටහන |

## 2.1.6 දෙමාපිය, භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා සහිත කාන්තාවන් සඳහා රැකවරණය ලබාදීම

මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අතර, දෙමාපියන් සහ භාරකරුවන් අහිමි දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 16- 59 අතර පසුවන බුද්ධි ඌනතා සහිත කාන්තාවන්ට රැකවරණය ලබාදීමේ අරමුණින් පිහිටුවා තිබේ.

2025 වර්ෂයේ දී සේවාලාභින් 35ක් සඳහා රැකවරණය ලබාදී ඇති අතර, රැකවරණය ලැබූ පිරිසෙන් වැඩිම ප්‍රමාණයක් මන්ද මානසික ආබාධ සහිත වූවන් වේ. මොවුන් සඳහා ආහාර, නවාතැන්, වෛද්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නොමිලේ ලබා දෙමින් රැකවරණය සපයා තිබේ.

**බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය**
**සපයන ලද සේවාවන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම |
|---|---|---|
| 01 | කායික සංවර්ධනය | - වෛද්‍ය සායන, ශාරීරික අභ්‍යාස (ආබාධ සහ වයස් මට්ටම් අනුව) |
| 02 | මානසික සංවර්ධනය | - ආගමික වැඩසටහන්, (දානමය කටයුතු, පිරිත් සජ්ඣායනා, ධර්ම දේශනා), විවෘත පාසල් වැඩසටහන. |
| 03 | කුසලතා සංවර්ධනය | - ක්‍රීඩා, සෞන්දර්ය ,අත්කම් නිර්මාණ , පුහුණු වැඩසටහන්, නිල් කටරොළු වගාව, ගෙවතු වගාව, බාල දක්ෂිකා වැඩසටහන. |

## 2.1.7 සංඥා භාෂාව ප්‍රවර්ධනය

ආබාධ සහිත වූවන්ගේ සුබසාධන හා සංවර්ධන වැඩසටහන යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන තවත් එක් ව්‍යාපෘතියක් වන්නේ ශ්‍රව්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සැපයීමයි. ශ්‍රවණ හා කථනාබාධ සහිත ප්‍රජාවගේ සන්නිවේදනය පහසු කරමින් ඔවුන් වෙත වඩා ඵලදායී සේවාවක් ලබා දීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව 2025 වර්ෂයේදී සිදුකරන ලද කාර්යයන් පහත සඳහන් වේ.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන් හි අවශ්‍යතාවය අනුව සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම. විශේෂයෙන් අධිකරණ, පොලීසිය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, සහ ජන මාධ්‍ය ආයතනයන් සඳහා සේවය ලබාදීම.
- ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලයේ නිලධාරීන් සඳහා සංඥා භාෂා පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය එක්ව බස්නාහිර පළාත් රාජ්‍ය නිලධාරීන් 60 දෙනෙකු සඳහා මාස 06ක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.
- පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතනයන් සඳහා සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම
- පූර්ණ ශ්‍රවණ හා කථන ආබාධ සහිත පුද්ගලයින් සඳහා ශ්‍රව්‍යාබාධිත හැඳුනුම්පත් 38 ක් නිකුත් කිරීම.
- ජාත්‍යන්තර සංඥා භාෂා දින ජාතික උත්සවයට සමගාමීව ශ්‍රවණ හා කථනාබාධ සහිත ප්‍රජාවගේ ගැටලු ඉදිරිපත් කිරීම වෙනුවෙන් 0706116000 නව දුරකථන අංකයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර සංඥා භාෂා දින ජාතික උත්සවයට සමගාමීව තරුණ ශ්‍රවණ හාකථන ආබාධ සහිත පුද්ගලයින් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

### ආබාධ සහිත වූවන් සඳහා වන සුබසාධන හා සංවර්ධන වැඩසටහන
### භෞතික හා මූල්‍ය ප්‍රගතිය
### වැය ශීර්ෂය 216 – 02- 03 – 1- 1501 (2025/12/31 දිනට)

| අනු අංකය | ක්‍රියාකාරකම හා භෞතික ප්‍රගතිය | වියදම රු.මි |
|---|---|---|
| 01. | වෘත්තීය පුහුණුව,කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන හා ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සඳහා සේවා ලබා දීම<br>i. අමු ද්‍රව්‍ය වියදම<br>ii. වෙනත් සුභසාධන වියදම්<br>iii. උපදේශන පුහුණු දීමනා<br>iv. අධ්‍යාපන චාරිකා | 26.85 |
| 02. | දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යථායෝග්‍යාධාර ලබාදීම.<br>i. බිහිරි සේවා මණ්ඩලය<br>ii. ස්වර්ණදාම පදනම<br>iii. මාලමුල්ල සෙත්සරණ සංවර්ධන මධ්‍යස්ථානය<br>iv. බෙන්තර ශ්‍රී ගුණරත්න නාහිමි අනුස්මරණ කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>v. පුද්ගල සංවර්ධන පදනම බණ්ඩාරවෙල | 0.65 |
| 03. | ආබාධ සහිත ළමුන් සඳහා සේවා සපයන ස්වෙච්ඡා සංවිධාන, පෙර පාසල්, ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන, කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන හා වෘත්තීය පුහුණු ආයතනවල ගුරුවරුන් හට ගුරු දීමනා ලබා දීම. ගුරුවරුන් සංඛ්‍යාව - 57 | 7.63 |
| 04. | වෘත්තීය පුහුණු ආයතන නිල ඇඳුම් - ටී ෂර්ට්, බොටම | 3.50 |
| 05. | වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභින් සඳහා මෙවලම් කට්ටල ලබාදීම | 6.09 |
| 06 | නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය සඳහා සේවා සැපයීම | 0.25 |
| 07 | පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටන් පැවැත්වීම - ගුරුවරුන් 500 | 1.0 |
| 08 | පොසොන් බැති ගී සරණිය | 0.46 |
| 09 | කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ළමුන් තෝරා ගැනීමේ මූලික පරීක්ෂණය | 2.78 |
| 10 | කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම | |
| | වියදම එකතුව | **49.21** |
| | වෙන් කළ ප්‍රතිපාදන | **50.00** |

### ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන භෞතික හා මූල්‍ය ප්‍රගතිය
### වැය ශීර්ෂය 216-02-03-13 – 1501 (2025/12/31 දිනට)

| අනු අංකය | ක්‍රියාකාරකම හා භෞතික ප්‍රගතිය | ප්‍රතිපාදන රු. | වියදම රු.මි |
|---|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන සහ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානවල දරුවන් සඳහා අභ්‍යාසලාභී දීමනා ගෙවීම (එක් අයෙකු සඳහා රු. 150/-) සංඛ්‍යාව 496 | 30.00 | 27.02 |
| 02. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා ආයතනවල සේවාලාභීන් 298 ක් සඳහා අභ්‍යාසලාභී දීමනා ගෙවීම | | |

### ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය
### වැය ශීර්ෂය 216-02-03 – 1203 (2025/12/31 දිනට)

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු. | වියදම රු.මි |
|---|---|---|---|
| 01 | වෘත්තිය පුහුණු ආයතන වල ආහාර සඳහා ගෙවීම් කිරීම හා නිවාස පාලක,උපස්ථායක නිලධාරීන් සඳහා නිළ ඇඳුම් දීමනා ගෙවීම | 133.5 | 99.52 |

### ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය
### වැය ශීර්ෂය 216-02-04 – 1203 (2025/12/31 දිනට)

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු. | වියදම රු.මි |
|---|---|---|---|
| 01 | රිදියගම නිවර්තන නිවාසයේ ආහාර සඳහා ගෙවීම් | 93.74 | 70.98 |

### 2.1.8 ආබාධ සහිත දරු දැරියන්ගේ ක්‍රීඩා, සංස්කෘතික හා කලා කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය

සමාජ සේවා දෙපාර්තමේන්තුව ආබාධ සහිත දරු දැරියන්ගේ වෘත්තිමය හැකියාවන් බලගැන්වීම සිදු කරන අතරම, ඔවුන් සතු සෞන්දර්යාත්මක හා ක්‍රිඩා කුසලතාවයන් ඔප්නංවා සෞඛ්‍ය සම්පන්න ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස සමාජගත කිරීම සඳහා ද මූලික වී කටයුතු කරනු ලබයි.

ඒ අනුව 2025 වර්ෂයේදී දිවයිනේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි තරඟ ඉසව් 62ක් යටතේ පවත්වන ලද ක්‍රිඩා තරඟ වලින් පරිසාධන මට්ටමට ලඟා වූ ආබාධ සහිත තරුණ තරුණියන් 348 දෙනෙකු ජාතික තරඟාවලිය සඳහා යොමු කරනු ලැබිණි. 2025 අප්‍රේල් මස 04 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රිඩාංගනයේදි පැවති ජාතික මළල ක්‍රිඩා තරඟාවලියේදි පරිසාධන මට්ටමට ලඟා වූ ආබාධ සහිත තරුණ ක්‍රිඩක ක්‍රිඩිකාවන් 72 දෙදෙනෙකු පැරාලිම්පික් යොවුන් තරඟාවලිය සඳහා යොමු කිරිමට හැකි වී තිබේ.

- ❖ **ආබාධ සහිත වූවන්ගේ ජාතික සංස්කෘතික ප්‍රසංගය " සිත් රූ "**

ආබාධිත ප්‍රජාවගේ විවිධ කලා හැකියාවන් හඳුනා ගනිමින් ඔවුන්ගේ ප්‍රාසාංගික හැකියාවන් එළි දැක්වීමට වේදිකාවක් නිර්මාණය කර දීමත්, වටිනාකමක් ලබාදී ඇගයීමට ලක් කිරිම, වෙනුවෙන් පළාත් මට්ටමින් තරඟ සඳහා ඉදිරිපත් වූ ආබාධ සහිත තරුණ තරුණියන් 640කුගේ සහභාගිත්වයෙන් පැවති නර්ථනාංගයන් අතුරින් ජයග්‍රහණය කල නර්ථන කණ්ඩායම් සඳහා ජාතික මට්ටමේ තරඟය සඳහා ආබාධ සහිත තරුණ තරුණියන් 384 ක් සහභාගි විය. එම තරඟය අවසානයේ ත්‍යාග, කුසලාන සහ සහතිකපත් ප්‍රධානය සහ ප්‍රසංගය 2025 අගෝස්තු මස 08 වන දින නෙළුම් පොකුණ රඟහලේදි ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

### 2.1.9. ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (සී. බී. ආර්.)

ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා අවශ්‍ය සේවාවන් වැඩි දියුණු කිරිම, සමාන අවස්ථා සම්පාදනය කිරිම, මානව හිමිකම් ආරක්ෂා කරමින් ආබාධ සහිත පුද්ගලයන් කායික, මානසික හා සමාජයිය වශයෙන් නගා සිටුවීම මේ යටතේ සිදුකෙරේ. මීට අමතරව, එම ප්‍රජාවගේ පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජයිය යහපැවැත්ම තහවුරු කිරීමේ විවිධ වැඩසටහන් ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය
වැය ශීර්ෂය 216 -02 -03 -5 – 2509 (2025/12/31 දිනට)

| අනු අංකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 01 | දිරිය නිපයුම් - 2025 ආබාධ සහිත වූවන්ගේ ජාතික වෙළඳ හා වෘත්තීය නිපුනතා ප්‍රදර්ශනය | (දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරිමට නොහැකි විම). දෙපාර්තමේන්තුව මට්ටමින් දිරිය පොළ වැඩසටහන පවත්වන ලදී. | 7,872,720.00 | 1,948,354.50 |
| 02 | ආබාධ සහිත පුද්ගලයින් සඳහා උපකරණ හා සේවා ලබාදීම (සෘජු ආධාර)<br>*කොමඩ් වැසිකිලි<br>*විදුලිය ලබාදීම<br>*වායු මෙට්ට<br>*ජල මෙට්ට<br>*ජල පහසුකම්<br>*වෙනත් | 30<br>08<br>03<br>03<br>02<br>06<br>08 | 750,000.00 | 736 ,529.00 |
| 03 | ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන/සාකච්ඡා ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ප්‍රාදේශීය /දිස්ත්‍රික් /ජාතික<br>1370 | 3,250,000.00 | 2,989,361.00 |
| 04 | රෝහල් සුභසාධන වැඩසටහන්, නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 03 | 100,000.00 | 38,295.00 |
| 05 | ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 68 | 1,000,000.00 | 883480.00 |
| 06 | පරිපාලන වියදම් | සී.බී.ආර්.අංශයේ දුරකථන බිල්පත්, ලිපි ද්‍රව්‍ය ඉන්ධන හා අනෙකුත් පොදු වියදම් | 400,000.00 | 400,000.00 |
| 07 | සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 36 වැඩසටහන්<br>49 පුද්ගලයින් | 5,000,000.00 | 4,879,376.00 |
| | | | **18,372,720.00** | **11,875,395.50** |

## 2.1.10 දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම අරමුණු කරගනිමින්, දිවයින පුරා විසිරී සිටින දෘශ්‍යාබාධිත ප්‍රජාවට හා ඔවුන්ගේ පවුල්වල සුභසාධනය උදෙසා විවිධ වැඩසටහන් මේ යටතේ සිදු කෙරේ. 2025 වර්ෂය තුළ සැළසුම් කරන ලද වැඩසටහන් හා ඒ තුළින් අත්කරගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03-3-1501 (2025/12/31 දිනට)

| අනු අංකය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 01 | අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | | 10,342,414.00 | 8,839,972.00 |
| | i. දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සහ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම<br>ii. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා සුහුරු ජංගම දුරකතන ලබා දීම<br>iii. දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සඳහා බ්‍රේල් රයිටර් ලබා දීම | සිසුන් 303<br>18<br>3 | | |
| 02 | වෘත්තීය පුහුණු | පුහුණුලාභීන් 3 | 130,000.00 | 78,000.00 |
| 03 | පුනරුත්ථාපන ආධාර | | 1,871,000.00 | 1,870,621.00 |
| | i. උපදේශක දීමනා | උපදේශකවරුන් 05 | | |
| | ii. පුහුණුලාභීන් සඳහා ශිෂ්‍ය දීමනා | පුහුණුලාභීන් 19 | | |
| | iii.විදුලිය හා පානීය ජලය ලබාදීම | ප්‍රතිලාභීන් 01 | | |
| | iv. කථන පුස්තක | මුද්‍රිත පිටු 32,000 කට අදාල පුස්ථක | | |
| 04 | අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර | අක්ෂි කාච 03 | 400,000.00 | 102,847.00 |
| 05 | සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය | උත්සව 01 | 3,266,586.00 | 3,266,586.00 |
| 06 | ස්වයං රැකියා ආධාර | පුද්ගලයින් 13 | 440,000.00 | 440,000.00 |
| 07 | ක්‍රීඩා ආධාර | පාසල් 08 | 700,000.00 | 499,000.00 |
| 08 | දෘශ්‍යාබාධිත සංවිධාන ඉල්ලීම් | | 200,000.00 | 47,381.25 |
| 09 | පරිපාලන හා අනෙකුත් වියදම් | | 1,367,000.00 | 1,288,472.29 |
| 10 | විගණන ගාස්තු | | 175,000.00 | 168,504.00 |
| 11 | මූල්‍ය වියදම් | | 3,000.00 | - |
| 12 | විවිධ වියදම් | | 105,000.00 | 71,751.13 |
| | එකතුව | | **19,000,000.00** | **16,673,134.01** |

### 2.1.11 අයාල ආඥා පනත යටතේ අධිකරණයන් මඟින් වැරදිකරුවන් වන පුද්ගලයින් සඳහා රැකවරණය ලබාදීම සහ පුද්ගලයින් සමාජගත කිරීම.

අයාල ආඥා පනතට අනුව වැරැදිකරුවන් වන පුද්ගලයින් අධිකරණ නියෝග මත යොමු කරනු ලබන එකම ආයතනය වනුයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රිදියගම කළණ නිවර්තන නිවාසයයි. මේ වනවිට රිදියගම කළණ නිවර්තන නිවහන තුල උසාවි නියෝගයන් මඟින් යොමු කර ඇති සේවාලාභී පුද්ගලයින 516ක් සඳහා සේවාවන් සපයනු ලබයි.

සේවාලාභි සුබසාධනය උදෙසා සිදුකරන ලද වැඩසටහන් අතර,

- නේවාසිකයින් පුනරුත්ථාපන කටයුතු හා සම්බන්ධ කිරීම. (කෘෂි වගා, ආහාර තාක්ෂණය, මල් වගා කටයුතු, හා මුළුතැන්ගෙයි කටයුතු)
- මැහුම් පුහුණු පාඨමාලව සහ ඉදල් කොහු නිෂ්පාදන පුහුණුව ලබාදීම
- මාසිකව නේවාසික පියස් මට්ටමින් ගී රස වින්දන වැඩසටහන් පැවැත්වීම
- සර්ව ආගමික වැඩසටහන්, සිංහල අවුරුදු උත්සව, වෙසක්, පොසොන් හා නත්තල් උත්සව සංවිධානය.
- සෞඛ්‍ය සායන පැවැත්වීම.
- සෑම මසකම පොහොය දිනයන් වෙනුවෙන් ආගමික වැඩසටහන් පැවැත්වීම.
- විවෘත පාසල් ඒකකය කළණ මිතුරු- අකුරු ලියමු වැඩසටහන ඇරඹීම.
- නේවාසිකයින් සමාජගත කිරීමට අදාළව මැහුම් පාඨමාලාවක් ආරම්භ කිරීම.

මීට අමතරව, සේවාලාභීන් සමාජ ගත කිරීමට අදාළව සකස් කරන ලද සත්කාරක සැලසුම් සංඛ්‍යාව 40කි. ඒ අතුරින් සමාජ ගත කිරීම සඳහා තෝරාගන්නා ලද සේවාලාභීන් සංඛ්‍යාව 26ක් වන අතර, 2025 වර්ෂය අවසාන වන විට සමාජගත කර ඇති සේවාලාභීන් සංඛ්‍යාව 13කි.

## 2.2 මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ වැඩසටහන

සැබෑ ජීවන දර්ශනය හා ජීවිතයේ සැබෑ සතුට අවබෝධය තුලින් හැකියාවන් ඔප් නැංවීමත්, මතට ඇති නැමියාව අවම කර මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කරමින් ජාතික සංවර්ධනයට දායක කරවීම අරමුණු කරගනිමින් පුවක්පිටිය "ජයවිරු සමාධි" ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන එකම මත් පුනරුත්ථාපන මධ්‍යස්ථානය වේ.

ප්‍රධාන වශයෙන්ම මෙම ආයතනයේදී මනෝ චිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරනු ලබයි. මාස 06ක පුනරුත්ථාපන කාලය තුළ සේවාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා භාවනා, ආගමික වැඩසටහන් හා යෝගී ව්‍යායාම පැවැත්වීම් සිදු කෙරේ. සේවාලාභීන් පුනරුත්ථාපනය වන කාලය තුළ නේවාසික පහසුකම්, ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. සේවාලාභීන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණුවක්ද නේවාසික කාලය තුළ ලබා දෙනු ලබයි.

2025 වසර ආරම්භයේදී සේවාලාභීන් 36 දෙනෙකු සඳහා පුනරුත්ථාපන සේවා සැපයීම සිදු කළ අතර, වසර තුළ සමස්ථයක් ලෙස සේවාලාභීන් 114 දෙනෙකු සඳහා ආයතනය මගින් පුනරුත්ථාපන සේවා සපයා ඇත. ඉන් 98 දෙනෙකු පුනරුත්ථාපනය වූවන් ලෙස සමාජගත කර ඇත.

මීට අමතරව, දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් **"මත් එපා ගම්පුරා "** තේමාව කරගනිමින් ප්‍රජා මත් නිවාරණ වැඩසටහන්ද සිදු කෙරේ.

**මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය 216- 02-03-2-1501 – (2025/12/31) දිනට**

| ක්‍රියාකාරකම | වෙනු වූ ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ප්‍රජා මත් නිවාරණ වැඩසටහන (දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින්)** | **1.5** | **1.20** | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මට්ටමින් සහ පුවක්පිටිය මත් පුනරුත්ථාපන ආයතනය ඇතුලුව පාසල් ළමුන්, ප්‍රජාව සහ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 32ක් පැවැත්වීම. |

## 2.3 ආබාධ සහිත ප්‍රජාව සඳහා රැකියා සහාය ප්‍රවර්ධනය සඳහා වන ව්‍යාපෘතිය **Employment Support For Persons with Disabilities (ESPD)**

මෙම ව්‍යාපෘතිය සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතන මඟින් (JICA) ආබාධ සහිත පුද්ගලයන්ගේ රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ නැංවීම මූලික අරමුණ කර ගනිමින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. (Employment Support For Persons with Disabilities (ESPD)

සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව සමඟ එකඟතා ගිවිසුමක් මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් සේවයේ නියුතු සමාජසේවා නිලධාරීන් හා මානව සම්පත් සංවර්ධන නිලධාරීන් මඟින් සබඳතා නිර්මාණය කිරීමේ වැඩසටහන මඟින් (Linkage Creation Program -2025 වර්ෂයේදී මුළු රැකියාගත කිරීම් 338ක් සිදුකර ඇත.

ESPD ව්‍යාපෘතියේ 2 වන පියවර වශයෙන් 2025 වර්ෂයේ රැකියා අපේක්ෂිත ආබාධ සහිත පුද්ගලයන් සහ මේ වන විට රැකියාගත කල ආයතන හා හඳුනාගත් අනෙකුත් ආයතන සමඟ පාර්ශවකරුවන්ගේ රැස්වීම් (Stakeholder Meeting – SHM) 07ක් පැවැත්වීම

1. සබඳතා නිර්මාණය කිරීමේ වැඩසටහන (Linkage Creation Program) තව දුරටත් සාර්ථක කරගැනීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන් සහ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම (Joint Progress Meeting) 03 පැවැත්වීම

2. ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් (Joint Progress Meeting - JPM) 25ක් පැවැත්වීම.
3. සමාජ සේවා දෙපාර්තමේන්තුව තුල රැකියා ප්‍රවර්ධන ඒකකය (Employment Support Unit) ස්ථාපිත කිරීම .

4. පළාත් මට්ටමින් සම්මාන ප්‍රධානෝත්සව 07ක් පැවැත්වීම මඟින් නිලධාරීන්, ආයතන හා ආබාධ සහිත රැකියාලාභීන් ඇගයීමට ලක් කිරීම.

5. රැකියාගත කරන ලද ආබාධ සහිත පුද්ගලයින් රැකියාව තුල රඳවා තබා ගැනීමේ අරමුණින් **''සිහින ශ්‍රී** ලංකා '' නමින් වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 88 ක ආරම්භ කිරීම .එහිදි ආබාධ සහිත ප්‍රජාව අතරින් රැකියා සිදු කරන්නන්ට දෛනික රැකියා පරිසරයෙන් බැහැරව ඔවුන්ගේ සම කණ්ඩායම් සමඟ විනෝදයෙන් කාලය ගත කිරීම සඳහා අවස්ථාව සලස්වාදීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

## 2.4 සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ජාතික පර්යේෂණ කණ්ඩායමක් පිහිටුවීම

වර්තමානයේ පවතින සමාජ ගැටලු සංකීර්ණ බැවින්, එම ගැටලු හදුනා ගැනීමට සහ හදුනාගන්නා ගැටලු වලට විසදුම් විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කර ගන්නා නිගමණයන් රටක ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අවශ්‍ය නිර්දේශයන් ලබාදීම වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පර්යේෂණ කණ්ඩායමක් පිහිටුවා තිබේ.

ඒ අනුව 2025 වර්ෂයේදි පිහිටුවන ලද මෙම පර්යේෂණ කණ්ඩායම සඳහා දිස්ත්‍රික්කයන් 25ම ආවරණය වන පරිදි නිලධාරීන් 25 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් තෝරා ගැනීම. තෝරා ගන්නා ලද නිලධාරීන් සඳහා දින දෙකක (02) නේවාසික පුහුණුවක් ලබාදීම.සමාජ ගැටලු විග්‍රහ කරමින් පර්යේෂණ මාතෘකා 2ක් යටතේ ප්‍රශ්නාවලි නිර්මාණය කිරීම සිදුකර ඇත.

## 2.5 දිස්ත්‍රික් මට්ටමින් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම

"එක්ව අත්නොහැර" සංකල්පය යටතේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, ඔවුන් අන්තර්කරණය වූ සමාජයක අභිමානයෙන් යුතුව ජීවත්වීම සඳහා සවිබලගැන්වීමට අවස්ථාව ලබාදීමත් වෙනුවෙන් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ කාර්යභාරය සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරිණි.

වයස මාස 06 සිට අවුරුදු 18 අඩු ආබාධ සහිත දරුවන් සඳහා දිවා කාලයේ දී කුසලතා වර්ධනය සමඟින් රැකවරණය මැනවින් තහවුරු වන රාජ්‍ය යාන්ත්‍රණයක අවශ්‍යතාවය රට තුල පවතින බැවින්, ඒ සඳහා සුදුසු පිළියමක් වශයෙන් දෙමාපිය /භාරකරුවන් සහිත, යම් මට්ටමකට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව ඇති (ඇඳගත නොවන හා උග්‍ර මානසික ආබාධ නොමැති) ආබාධ සහිත දරුවන් සඳහා පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, සියලු දිස්ත්‍රික්කයන් ආවරණය කරමින් ආරම්භ කිරීමට අපේක්ෂිතය.

ඒ අනුව 2025 වර්ෂයේදි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ඔට්සම් සහිත ආබාධ සහිත දරුවන් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙනුවෙන් වෙන්ව තිබූ රු.මි. 250.00 ක ප්‍රතිපාදන සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් හඳුනාගන්නා ලද දිස්ත්‍රික්ක අටක් (08) තුල (කුරුණෑගල, අනුරාධපුර, ගාල්ල, මාතර, හම්බන්තොට, කලුතර, ත්‍රිකුණාමලය, සහ කෑගල්ල) කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට අදාළ කටයුතු ආරම්භ කර තිබේ.

## 2.6 ජයග්‍රහණ

- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ හැකියාවන් හා දුර්වලතාවන් හඳුනාගනිමින් අභ්‍යාසලාභීන් 352ක් සඳහා තනි පුද්ගල සංවර්ධන සැලැස්මට අනුව සංවර්ධනය කර වෘත්තීය පුහුණුව ලබාදී සමාජගත කිරීම.
- වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා ස්වයංරැකියා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර මෙවලම් කට්ටල 84 ක් ලබාදීම.
- ආබාධ සහිත පුද්ගලයන් 66 දෙනෙකු සඳහා රැකියා අවස්ථා ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා මාර්ගෝපදේශනය ලබා දීම.
- රැකියාගත ආබාධ සහිත පුද්ගලයන් රැකියාව තුළ රඳවා ගැනීමේ වැඩසටහනක් ලෙස සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම " **සිහින ශ්‍රී ලංකා**" නමින් සංවිධානයක් ආරම්භ කිරීම. 2025 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 88ක් තුළ ක්‍රියාත්මක කිරීම
- රැකියා ප්‍රවර්ධන ඒකකයක් ජාතික මට්ටමින් ස්ථාපිත කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින් 338ක් සඳහා පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීමට හැකිවීම.
- රැකියා ප්‍රවර්ධන ඒකකයට (ESU) අදාලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- රිදියගම නිවර්තන නිවාසයේ සේවාලාභීන් සමාජ ගත කිරීම අරමුණු කර ගනිමින් සත්කාරක සැලසුම් සකස් කිරීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා සිද්ධි අධ්‍යයන සිදුකර සත්කාරක සැලසුම් 4ක් සකස් කිරීම.

## 2.7 අභියෝග

- සාර්ථකව වෘත්තීය පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සක්‍රිය ලෙස ආර්ථිකයට දායකවන පරිදි තිරසර ලෙස රැකියාගත කිරීම සහ රැකියාවන් තුළ දීර්ඝකාලීනව රඳවා ගැනීමේ අපහසුතාවය.
- ශ්‍රී ලංකාවේ ආබාධ සහිත ප්‍රජාව සඳහා අධ්‍යාපනය හා රැකියා යන ක්ෂේත්‍රයන් තුළ අන්තර්කරණ ඉඩ ප්‍රස්ථාවන් ලබාදීම ප්‍රායෝගිකව දුෂ්කර වීම.
- දිගුකාලීනව රැකවරණය අවශ්‍ය ආබාධ සහිත ප්‍රජාව (ආබාධ සහිත දරුවන්, කාන්තාවන්, සහ වැඩිහිටියන්) සඳහා ආරක්ෂාව,රැකවරණය ලබා දීම සඳහා ප්‍රමාණවත් සම්පත් හා පහසුකම් නොමැතිවීම.
- රෝහල් සුභසාධන සේවාවන්වල නියුතු නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම හා සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම.

- ආයතන ක්‍රමවත්ව පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රශස්ත  කාර්ය මණ්ඩල, රජයේ ප්‍රතිපත්ති අනුව සීමා කිරීම මත බඳවා ගැනීමට නොහැකි වීම.

- ආබාධ සහිත ප්‍රජාව සවිබල ගන්වා අන්තර්කරණය කිරීම සඳහා රැකියා වෙළඳපොළ  අවස්ථා අවම වීම.

- සේවා ස්ථාන තුළ සාධාරණ ඉඩකඩ සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සේවායෝජකයින් දැනුවත් වීම අවම වීම.

## 2.8 ඉලක්ක

- වෘත්තිය පුහුණුව නිම කිරීමට ආසන්නව සිටින අභ්‍යාසලාභීන් සඳහා රාජ්‍ය/පෞද්ගලික අංශයන් සමඟ සම්බන්ධ කර සේවාස්ථ පුහුණුව ලබාදීම හා ILO ආයතනය හා එක්ව ආබාධ සහිත  තරුණ තරුණියන් සඳහා ඇහලුම් ක්ෂේත්‍රය තුළ රැකියා නියුක්තිය වැඩි කිරීම.
- රැකියා ප්‍රවර්ධන ඒකකය මඟින් දිවයිනම ආවරණය වන පරිදි (ESU) ආබාධ සහිත ප්‍රජාව සඳහා වැඩි රැකියා අවස්ථා සලස්වාදීම.
- නිවර්තන නිවාසයේ රැඳවියන් අතුරින් සත්කාරක සැලසුම් අනුව තෝරාගත් පුද්ගලයින් සමාජගත කිරීම.
- දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත පර්යේෂණ කණ්ඩායම මඟින් සාර්ථක සමාජ ගැටලු 2ක් හඳුනාගෙන පර්යේෂණ සිදුකර  නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නිලධාරීන්ට සහ පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව  සඳහා සංඥා භාෂා පුහුණුව තුළින් සංඥා භාෂාව ප්‍රචලිත කිරීම.
- ජාතික මට්ටමේ උත්සව හරහා ආබාධ සහිත පුද්ගලයින් සමාජ සවිබල ගැන්වීම මෙන්ම ජාතික හා ජාත්‍යන්තර තලයේ ඇගයීමට ලක් කිරීම.

..............................

ගණන් දීමේ නිලධාරී
නම:- ඩබ්.ජී. දර්ශනී කරුණාරත්න
තනතුර:- සමාජ සේවා අධ්‍යක්ෂ
දිනය:- 2025. 05 . 08

දර්ශනී කරුණාරත්න
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 වන මහල, සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල.

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය**

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

ඒසීඒ - එෆ්

රු

| අයවැය | | සටහන | තත්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | **2025** | **2024** | |
| | ආදායම් ලැබීම් | | - | - | |
| | ආදායම් බදු | 1 | - | - | |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | | | |
| | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | |
| | **මුළු ආදායම් ලැබීම්(අ)** | | | | |
| | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 810,790,000 | 653,773,000 | |
| | තැන්පතු | | 6,628,882 | 5,991,329 | ඒසීඒ 3 |
| | අත්තිකාරම් ගිණුම් | | 27,959,935 | 27,134,336 | ඒසීඒ-4 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | ඒසීඒ-5 |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **845,378,817** | **686,898,666** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ=(අ)+(ආ)** | | **845,378,817** | **686,898,666** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 333,566 | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම්** | | **845,045,251** | **686,898,666** | |
| | අඩු කළා:වියදම් | | - | - | |
| | පුනරාවර්තන වියදම් | | - | - | |
| **943,800,000** | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 933,457,990 | 776,651,355 | ඒසීඒ-2(ii) |
| **472,314,000** | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 368,957,151 | 346,535,877 | |
| **156,300,000** | සහනාධාර,ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 135,247,336 | 95,480,573 | |
| **-** | පොලී ගෙවීම් | 8 | - | - | |
| **50,000** | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 311,250 | |
| **1,572,464,000** | **මුළු පුනරාවර්තන වියදම(ඊ)** | | **1,437,662,478** | **1,218,979,055** | |
| | **මූලධන වියදම්** | | - | - | |
| **63,581,000** | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 10 | 35,456,107 | 26,459,473 | |
| **77,805,000** | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 76,520,425 | 51,400,288 | |
| **24,214,198** | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | 14,195,431 | - | |
| **-** | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| **3,650,000** | හැකියා වර්ධනය | 14 | 2,024,261 | 1,246,660 | |
| **-** | වෙනත් මූලධන වියදම් | 15 | - | 10,268,208 | |
| **169,250,198** | **මුළු මූලධන වියදම් (උ)** | | **128,196,225** | **89,374,628** | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | | | |
| | තැන්පතු ගෙවීම් | | 7,426,328 | 4,269,359 | ඒසීඒ- 4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 32,467,295 | 25,889,841 | ඒසී-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 39,893,623 | 30,159,200 | |

| | | | | |
|---|---|---|---|---|
| 1,741,714,198 | මුළු වියදම එ = (ඊ+උ+ඌ) | | 1,605,752,325 | 1,338,512,884 |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (760,707,074) | (651,614,218) |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (760,707,074) | (651,614,218) |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | – | – |
| | | | (760,707,074) | (651,614,218) |

[illegible]-7

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ACA-P**

**2025 දෙසැම්බර් 31 දිනට**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | | සත්‍ය | |
|---|---|---|---|---|
| | | | **2025 රු.** | **2024 රු .** |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ 6 | | 1,237,387,725 | 1,155,306,458 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ 5/5(ඒ) | | 62,856,176 | 58,348,816 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ- 3 | | | - |
| මුළු වත්කම | | | **1,300,243,901** | **1,213,655,275** |
| <u>ශුද්ධ වත්කම්/ස්කන්ධය</u> | | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | | 61,593,777 | 56,288,971 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | | 1,237,387,725 | 1,155,306,458 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5 (බී) | | - | - |
| <u>ජංගම වගකීම්</u> | | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ 4 | | 1,262,399 | 2,059,845 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ 3 | | - | - |
| මුළු වගකීම | | | **1,300,243,901** | **1,213,655,275** |

පිටු අංක 40 සිට 43 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 44 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත්, මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි | නම: පී.කේ.ජී.ටී.එන්.එම්. කුලරත්න |
| නම: සම්පත් මන්ත්‍රීනායක | නම : ඩබ්.ජී. දර්ශනී කරුණාරත්න | තනතුර : ප්‍රධාන ගණකාධිකාරී |
| තනතුර: ලේකම් | තනතුර : සමාජ සේවා අධ්‍යක්ෂ | දිනය : 2026. 05.08 |
| දිනය : 2026. 05.19 | දිනය : 2026. 05.08 | |

සම්පත් මන්ත්‍රීනායක
ලේකම්
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
6 වන මහල, අදියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

දර්ශනී කරුණාරත්න
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 වන මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල.

පී.කේ.ජී.ටී.එන්.එම්. කුලරත්න
ප්‍රධාන ගණකාධිකාරී
සමාජ සේවා දෙපාර්තමේන්තුව
2 වන මහල, II අදියර
සෙත්සිරිපාය - බත්තරමුල්ල

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඑ් - සී

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**

**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | සතය | |
|---|---|---|
| | **2025** | **2024** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | - | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ මගින් එකතුකරන ලද ආදායම් | 25,378,485 | 18,730,438 |
| අග්‍රිම ලැබීම් | 810,790,000 | 653,773,000 |
| අත්තිකාරම් අයකරගැනීම් | 28,063,469 | 26,413,396 |
| තැන්පතු ලැබීම් | 6,628,882 | 5,991,329 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ) | **870,860,835** | **704,908,164** |
| <u>අඩු කළා - මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 664,988,465 | 535,468,788 |
| සහනාධාර සහ මාරු කිරීම් | 105,270,651 | 73,296,295 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,808,549 | 29,119,767 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 333,566 | - |
| අත්තිකාරම් ගෙවීම් | 32,245,539 | 25,898,773 |
| තැන්පතු ගෙවීම් | 7,426,328 | 4,269,359 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ) | **814,073,098** | **668,052,983** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | **56,787,737** | **36,855,181** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | - | - |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |

| | | |
|---|---|---|
| උපකරණ අය කර ගැනීම | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඇ) | - | - |
| <u>අඩු කළා - මුදල් වැය කිරීම</u> | - | - |
| මූලධන වියදම් | **56,787,737** | **36,855,181** |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ) | **56,787,737** | **36,855,181** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඊ)=(ඇ) - (ඉ) | **(56,787,737)** | **(36,855,181)** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ)=(ඇ) + (ඊ) | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | - | - |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය(ඌ) | - | - |
| <u>අඩුකළා - මුදල් වැය කිරීම</u> | - | - |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ) | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාළ නොවේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 1,545,700,000 | 1,572,464,000 | 1,437,662,478 | 91.43 |
| ප්‍රාග්ධන | 124,300,000 | 169,250,198 | 128,196,225 | 75.74 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 874,494,020 | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 283,773,904 | | | |
| 9153 | ඉඩම් | 79,100,000 | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 19,800 | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

## 3.9 විගණකාධිපති වාර්තා

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එල්එස්ඩබ්/බී/එස්එස්ඩී/එෆ්එස්/2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2026 ජුනි 25 දින |

ගණන්දීමේ නිළධාරී
සමාජ සේවා දෙපාර්තමේන්තුව

**ශීර්ෂය: 216 සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගෙවීම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවී ඇති විශ්‍රාම ගනු ලැබූ නිලධාරීන් 03 දෙනෙකුගේ ණය ශේෂය රු.284,727 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් බී ගිණුමෙහි සේවය අතහැරගොස් සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතුණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය අනුව වසර 14 කට පෙර සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 103,420 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත නිලධාරීන් 11 දෙනෙකුගේ අයවිය යුතු රු.77,500 ක ආපදා ණය අත්තිකාරම් වල නොපියවූ ශේෂය 2025 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අඛණ්ඩව ණය වාරික අය කළ යුතු වුවද නිලධාරීන් 11 දෙනෙකු වෙත ලබාදී තිබුණු ආපදා ණය ශේෂ එකතුව රු. 887,026 ක මුදලට අදාලව වසරකට වැඩි කාලයක සිට ණය වාරික අය කර නොතිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය පරිදි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සමාජසේවා දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබූ හෙක්ටයාර 12.3568 ක් වූ ඉඩම් කොටස් 04 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රිදියගම නිවර්තන නිවාසය පිහිටි ඉඩමෙහි අක්කර 54 ක ප්‍රමාණයක් පවරාගෙන තිබුණද එහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ආපදා ණය වාරික සමාජසේවා දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි නීත්‍යානුකූලව පවරා ගැනීමේ කාර්යයන් හා තක්සේරු කිරීමේ කාර්යයන් අවසන් වන තෙක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

3

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් හා දෙපාර්තමේන්තුව යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන වල පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| වැය පේරය | මු.රෙ. 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| සුළු මුදල් පොත (සීදූව වෘත්තීය පුහුණු ආයතනය) | මු.රෙ. 446 | පවත්වා නොතිබුණි. |
| නිවාඩු ලේඛනය (සීදූව වෘත්තීය පුහුණු ආයතනය) | ආයතන සංග්‍රහයේ පරිච්ඡේදයේ XII 1.7 | 190 පොදු ආකෘති පත්‍රය අනුව නිවාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2 (ආ) | සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු ආයතන 5 ක්,ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන 2 ක් නිවර්තන හා පුනරුත්ථාපන නිවාස 2 ක් පිහිටි ඉඩම් හෙක්ටයාර් 73.376 ක් හා හෙක්ටයාර 10.3804 වූ ඉඩම් කොටස් 5 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරා ගෙන මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි | 1.6.2 (ආ) |
| 3.2 (අ) | ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 5.2 ඡේදය පරිදි 2019.01.21 දින සිට 2024 ජනවාරි 20 දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා සිටින නිලධාරිනියක සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා නැවත සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව ගණනය කරන ලද රු. 667,920 ක දණ්ඩන මුදල් | 3.2 (අ) |

4

| | | |
|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | |
| 3.3 (ආ) | මුදල් රෙගුලාසි 371 (2) ( ආ) සහ 371(5) ඡේද ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා නිලධාරියා විසින් එම කාර්යය නිමවූ විගසම පියවීම් කළ යුතු වුවද වෘත්තීය පුහුණු ආයතනවල හා ප්‍රධාන කාර්යාලයේ අත්තිකාරම් ලබාගත් නිලධාරීන් විසින් වර්ෂය තුළ ලබා ගෙන තිබූ අත්තිකාරම් වටිනාකම් එකතුව රු. 2,094,063 ක් අවස්ථා 65 ක දී දින 16 සිට දින 336 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී පියවීම් සිදුකර තිබුණි. | 3.3 |
| 4.2 | කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 136 දරන ස්ථානයේ සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් 1992-2012 වර්ෂය දක්වා මත්ලෝලීන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස නවෝදා ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා වරිපනම් බදු ගෙවීමක් ද සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ගොඩනැගිල්ලෙන් ඉවත් වී තිබුණද ගොඩනැගිල්ලෙන් ඉවත් වීම නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2015.12.31 දක්වා හිඟ වරිපනම් බදු වශයෙන් රු. 2,789,684 ක් කොළඹ මහනගර සභා නාගරික භාණ්ඩාගාරය වෙත ගෙවීමට දෙපාර්තමේන්තුවට සිදු වී ඇත. තවද, මෙම ඉඩම හා ගොඩනැගිල්ලෙන් පදිංචිය හැරයාමේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු ආයතනයකට භාර නොදීම හේතුවෙන් වසර 12 ක ට වැඩි කාලයක් ඉහත ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | 4.5 |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 වියදම් කළමනාකරණය**

සංවර්ධිත සහයන් වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.9,214,198 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සම්පූර්ණ මුදලම ඉතිරිවී තිබුණි.

## 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 5.2 ඡේදය | 2019.01.21 දින සිට 2024 ජනවාරි 20 දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා සිටින නිලධාරිනියක සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා නැවත සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව ගණනය කරන ලද රු. 667,920 ක දණ්ඩන මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 100,000 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි316 | සිදුව වෘත්තීය පුහුණු ආයතනයේ පුහුණුව ලබන අභ්‍යාසලාභීන්ගේ ඉතිරිකිරීමේ පාස්පොත් සේප්පුවක ආරක්ෂිතව තැන්පත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 751. | සිදුව ආයතනයේ තොග පොත් ක්‍රමානුකූලව පවත්වා නොතිබුණි. |

## 3.3 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (අ) ,මු.රෙ 371 (2)( ආ) සහ 371 (5) ඡේද ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා නිලධාරියා අදාළ කාර්ය නිමකළ විගසම පියවිය යුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කාර්යාල වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිලධාරීන් 52 දෙනෙකු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා ගන්නා ලද තත්කාර්ය අතුරු අග්‍රිම රු.399,117 ක් කාර්ය නිම වීමෙන් පසු දින 13 සිට 93ක් අතර කාලයක් පියවා නොතිබුණි.

## 3.4 තැන්පතු

(අ) තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් සඳහා තාවකාලිකව රඳවා ගත් තැන්පතු ගිණුමේ 2025 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,262,399 ක් වූ ශේෂයෙහි ඇතුළත් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල නිලධාරීන්ගෙන් හා රිදියගම කළණ නිවර්තන නිවාසයේ නිලධාරීන්ගෙන් අයකර ගත් ආපදා ණය වාරික හා පොලිය රු.661,494 ක් වූ අතර එම වටිනාකම් වර්ෂය අවසානය දක්වාම අත්තිකාරම් බී ගිණුමට මාරු කර නොතිබුණි.

(ආ) 2024 වර්ෂයට අදාළව තාවකාලිකව තැන්පත් කරන ලද තැන්පත් වල එකතුව රු.111,294 ක් 2025 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) වෘත්තීය පුහුණු පාඨමාලා සාර්ථකව අවසන් කල වෘත්තීය පුහුණුලාභීන් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපාර සැලසුම් අනුව අවශ්‍ය කරනු ලබන මෙවලම් කට්ටල 140 ක් ලබාදීමේ කාර්ය වෙනුවෙන් රු.මිලියන 7ක් වෙන් කර තිබුණි. 2022/2023 වර්ෂයේ පාඨමාලා හදාරන ලද අභ්‍යාසලාභීන් සඳහා වෘත්තීය පුහුණු ආයතන 11 ක පවත්වන ලද පාඨමාලා 06 ක් සඳහා අභ්‍යාසලාභීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජිත ව්‍යාපාර සැලසුම් 84 කට අදාළව රු.මිලියන 6.09 ක උපකරණ කට්ටල ලබාදීමේදී ව්‍යාපාර සැලසුම්වල අවිධිමත්ව හා අසම්පූර්ණ බව සහ පාඨමාලාවට අනනය වූ ව්‍යාපාර සැලසුම් ඉදිරිපත් නොකිරීම සැලකිල්ලට ගෙන නොතිබුණි. පාඨමාලා උපදේශකවරුන් විසින් ව්‍යාපාර සැලැස්ම පිළිබඳවත් එම ව්‍යාපාර සැලසුම් සකස්කිරීමේ අරමුණ හා ඒවා පිළියෙල කරන ආකාරය පිළිබඳවත් සිසුන් දැනුවත් කර නොතිබුණු අතර අදාළ උපකරණ භාවිතා කර ස්වයං රැකියා/ව්‍යාපාර කටයුතු කරගෙන යාම පිළිබඳව අදාල වගකිව යුතු නිලධාරීන් විසින් පසු විපරම් කිරීමක්ද සිදුවී නොතිබුණි. ආබාධිත සිසුන්ට සමාජයේ අනෙකුත් අය සමඟ තනිව නැඟී සිටීමට වෘත්තීය පුහුණුව තුලින් ස්වයං රැකියාවන් සඳහා අත්වැලක් සැපයුවද ඊට සරිලන උපකරණ නියමිත කාලය තුල ලබා දීමට කටයුතු නොකිරීම තුලින් එම ස්වයං රැකියා සඳහා පාඨමාලා ඵලදායීව යොදා නොගැනීමෙන් වෘත්තීය පුහුණුව ලබා දීම තුලින් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරනු ලබන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර අවසාන කරන ලද එක් අවුරුදු පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 496 ක් වූ අතර ඉන් පාඨමාලා සාර්ථකව අවසන් කළ සංඛ්‍යාව 261 ක් විය. ඔවුන්ගෙන් 66 දෙනෙක් පමණක් රැකියා ගතකර තිබුණි.සාර්ථකව පාඨමාලා අවසන් කර රැකියාගත කිරීම වැඩි කිරීම සඳහා අවධානයට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන "ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබල ගැන්වීම තුලින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තියවේදීමය මැදිහත්වීම මගින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම" වෙනුවෙන් දෙපාර්තමේන්තුව සිදු කරන කාර්යයන් තුල නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රතිපත්ති සම්පාදනය සිදු කල යුතු වුවද ආබාධ සහිත තැනැත්තන් ඇතුළු අනෙකුත් ආන්තිකරණයට සහ අවාසි සහගත තත්ත්වයට පත් වරප්‍රසාද නොලත් ප්‍රජාවගේ සමාන අයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජ ආරක්ෂාව තහවුරු කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා ආදායම් උත්පාදනයට ප්‍රවේශ සැපයීම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම යන අරමුණු වල ප්‍රමාණවත් කාර්යයක් ඉටු කර නොතිබුණි.

#### 4.1.2. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

මූලධන වත්කම් ඉදිකිරීම් හා පුනරුත්ථාපනය සහ නඩත්තු යටතේ විදියගම කළුන නිවර්තන නිවාසය ගොඩනැගිලි පුනරුත්ථාපනය හා නඩත්තු වෙනුවෙන් ගොඩනැගිලි සහ ඉදිකිරීම් පුනරාවර්තන වැය විෂය යටතේ ශුද්ධ ප්‍රතිපාදනය රු.9,749,000 ක් ද ගොඩනැගිලි සහ ඉදිකිරීම් ප්‍රාග්ධන වැය විෂය යටතේ රු.34,561,000 ක් ද වෙන්කර තිබුණද හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තු ලබා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ඉන් පිළිවෙළින් රු.9,703,038 ක්

එනම් සියයට 92 ක් හා රු.26,421,487 ක් එනම් සියයට 76 ක් උපයෝජනය නොකොට ඉතිරි වී තිබුණු අතර ප්‍රතිපාදන වෙන්කර ගැනීමෙන් අපේක්ෂිත කාර්යයන් ඉටු කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) වෘත්තීය පුහුණු ආයතනවල ආහාරපාන සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම හෝ ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සීදුව වෘත්තිය පුහුණු ආයතනයේ ආහාරපාන සඳහා රු.8,693,895 ක් හා ආහාරපාන පිළියෙල කිරීමේ සේවක අනියම් වැටුප් වශයෙන් රු.2,058,774ක් වැය කර තිබුණද, අනියම් සේවකයන්ගේ පහසුව සලකා ආහාර මෙනුවේ සඳහන් ආහාර ද්‍රව්‍ය වෙනුවට වෙනත් දේ ලබා දීම තුළින් ආබාධිත සිසුන් වෙනුවෙන් ප්‍රමාණවත් පෝෂ්‍යදායී ආහාර ලබාදීමක් සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීම වෙනුවෙන් සේවකයින් 07 දෙනෙකු වෙනුවෙන් පෞද්ගලික සේවා ආයතනයකට රු.3,005,740 ක මුදලක් ගෙවා තිබුණද ආහාරපාන සපයන මුළුතැන්ගෙය ඇතුළු කාමර පද්ධතිය හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ළමා මාර්ගෝපදේශන හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 02 ක් හා වෘත්තීය පුහුණු ආයතන 04 ක් පිහිටි හෙක්ටයාර 5,969ක් වූ ඉඩම් පවරා ගෙන නොතිබුණි

### 4.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

තක්සේරු වටිනාකම රු.38,000,000 ක් වූ හෙක්ටයාර 2.7023 කින් යුත් තෙළඹුගල වෘත්තීය පුහුණු ආයතනය පිහිටි ඉඩමෙහි පොල් වගාව සහිත ඉඩම් කොටසෙහි කෙසෙල් හා පැණිදොඩම් අතුරු බෝග වගා ව්‍යාපෘතියක් පවත්වාගෙන ගොස් තිබුණි.පෞද්ගලික පාර්ශවයක් විසින් මෙම වගාවන් සිදුකර තිබුණු අතර මෙම ඉඩම යටිබිම් වගාව සඳහා 2024 ජූලි 15 දින සිට වසර 12ක කාලයක් සඳහා ආවරණ අනුමැතියට යටත්ව අවසර ලබා දුන් බව දන්වා තිබුණද ඊට අදාළ ගිවිසුම් හෝ බලපත්‍ර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.එසේම ආයතනයට අයත් කුඹුරු ඉඩමද වෙනත් පාර්ශවයක් විසින් වගා කර තිබුණි. ඉඩමෙහි පැවති ඵලදාව රහිත ගස් කපා දැමීමට ස්ථාන භාර නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ඉල්ලා තිබුණු අතර පොල්ලි පුණුම්දෙල්ල වැනි ගස් කිහිපයක් කපා දමා තිබුණු අතර ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත් බවට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් විධිමත් අධීක්ෂණයක් ද සිදු කර නොතිබුණි.

### 4.4 පාඩු හා හානි

(අ) පොත් වලින් කපා හැරීමේ ප්‍රකාශනයෙහි මු.රෙ 109 යටතේ සොයෙන් කපා හැරීම හා අයකර ගැනීම වශයෙන් මෝටර් රථයක් අනතුරට පත් වීමෙන් සිදුවූ අලාභය රු.355,300 ක් කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂය ලෙස දක්වා තිබුණි.මෙම මෝටර් රථය ග්‍රාමීය සංවර්ධන ප්‍රජා සවිබල ගැන්වීම අමාත්‍යාංශය සතු වන අතර තාවකාලික පදනම මත දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.ඒ අනුව මෙම අලාභ වටිනාකම දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වල ඇමුණුම (ii) යටතේ දැක්විය නොහැකි වුවත් එසේ දක්වා තිබුණි.

8

(ආ) සිදුව වෘත්තීය පුහුණු ආයතනයේ ආරක්ෂක නිලධාරීන් සඳහා අනුමැතියකින් තොරව රු. 40,820 ක් වටිනාකම් වූ ආහාරපාන සපයා තිබුණද එම මුදල් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 136 දරන ස්ථානයේ සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් 1992-2012 වර්ෂය දක්වා මත්ලෝලීන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස නවෝද්‍ය ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා වරිපනම් බදු ගෙවමින් ද සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ගොඩනැගිල්ලෙන් ඉවත් වී තිබුණද ගොඩනැගිල්ලෙන් ඉවත් වීම නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා හිඟ වරිපනම් බදු වශයෙන් රු. 2,789,684 ක් කොළඹ මහනගර සභා නාගරික භාණ්ඩාගාරය වෙත ගෙවීමට දෙපාර්තමේන්තුවට සිදු වී ඇත. තවද, මෙම ඉඩම හා ගොඩනැගිල්ලෙන් පදිංචිය හැරයාමේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු ආයතනයකට භාර නොදීම හේතුවෙන් වසර 12 ක ට වැඩි කාලයක් ගොඩනැඟිල්ල නිශ්කාර්යව පැවතීම සම්බන්ධව පසුගිය වර්ෂයේ වාර්තාවේ දක්වා තිබුණද ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි අනුමත තනතුරු 04ක්ද තෘතීය මට්ටමෙහි තනතුරු 300 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 65 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 30ක පුරප්පාඩු පැවතුණි.කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 160 ක් අනුමත කර තිබුණද එම සේවකයින් බඳවා ගෙන නොතිබුණු අතර පුරප්පාඩු පිරවීම අවශ්‍ය නොවේ නම් කාර්යමණ්ඩල සංශෝධනය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අනුබද්ධව සමාජසේවා නිලධාරී 25ක් වෘත්තීය උපදේශකයින් 25 ක්, ස්ථානභාර නිලධාරියෙකු ,සංඥා භාෂා පරිවර්තක නිලධාරීන් 05 ක් හා කළමනාකරණ සේවා නිලධාරීන් 07 දෙනෙකු එකම සේවා ස්ථානයක අවුරුදු 06 ත් 30 ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සේවයේ යෙදී සිටින අතර ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

කේ.කේ.එස් ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

9

## පරිච්ඡේදය 04

## ආයතනයේ කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 90% - 100% | 75% - 89% | 50% - 74% |
| 01. ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදුන් සංඛ්‍යාව - 496 | √ | | |
| 02. ළමා මාර්ගෝපදේශනය ලබාදුන් ආබාධ සහිත දරුවන් සංඛ්‍යාව - 196 | √ | | |
| 03. ප්‍රජා මූලික පුනරුපන වැඩසටහන යටතේ (සී.බී.ආර්) සෘජු ආධාර ලැබූ සංඛ්‍යාව - 30 | √ | | |
| 04. ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ (සී.බී.ආර්) විශේෂ ව්‍යාපෘති ආධාර ලැබූ ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව - 49 | | | |
| 05. ආශාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල යටතේ ප්‍රතිලාභ ලැබූ ආශාබාධිත පුද්ගලයන් සංඛ්‍යව - 368 | √ | | |
| 09. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 46 | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG)

| හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0 – 49% | 50 – 74% | 75 – 100% |
| **4.5**<br>**2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීම තහවුරු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.** | ආබාධ සහිත දරුවන් සඳහා ළමා මාර්ගෝපදේශය ලබා දීම හා පෙර පාසල් හා සාමාන්‍ය පාසල් අධ්‍යාපනයට යොමු කර වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය සැපයීම 200 | ළමා මාර්ගෝපදේශය සපයන ලද ආබාධ සහිත දරුවන් සංඛ්‍යාව - 196<br><br>සාමාන්‍ය පෙර පාසල් හා සාමාන්‍ය පාසල් වලට යොමු කිරීම් සංඛ්‍යාව 13 | | | √ |
| | වයස අවුරුදු 16-35 අතර වයසේ පසුවන ආබාධ සහිත පුද්ගලයන් 290 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා කුසලතා සංවර්ධනය කිරීම | වෘත්තීය පුහුණුව නිමකර විභාගය සමත් වූ සංඛ්‍යාව 261 | | | √ |
| | වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන්ගේ සංවර්ධනය සඳහා තනි පුද්ගල සංවර්ධන සැලසුම් සකස් කිරීම - 380 | සකස් කරන ලද තනි පුද්ගල සංවර්ධන සැලසුම් සංඛ්‍යාව - 352 | | | √ |
| | දශ්‍යාබාධිත භාර අරමුදල යටතේ සිසුන්ගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යාධාර ලබාදීම - 400 | ශිෂ්‍යාධාර ලබාදුන් සිසුන් සංඛ්‍යාව - 303 | | | √ |
| **8.5**<br>**2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම** | රැකියා අපේක්ෂිත ආබාධ සහිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා හෝ ආයතනගත රැකියා සඳහා යොමු වීමට අවශ්‍ය පුහුණු මගපෙන්වීම හා සම්බන්ධීකරණය | පෞද්ගලික අංශයේ රැකියා ගත කිරීම් -380<br>ස්වයංරැකියා සඳහා යොමු සංඛ්‍යාව - 26 | | | √ |
| **10.2** | දෙමව්පියන් සහ භාරකරුවන් අභිමි | රැකවරණය ලබාදුන් ආබාධ | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිත බව, ජන වර්ගය ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික හා දේශපාලනික අන්තර්කරණය සවිබලගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම** | පුද්ගලයින් සඳහා රැකවරණය ලබාදීම | සහිත පුද්ගල සංඛ්‍යාව - 126 | | | |
| | මතට ඇබ්බැහි වූවන් 100ක් පුනරුත්තාපනය කිරීම හා සමාජගත කිරීම | පුනරුත්ථාපනය හා සමාජ ගත කරන ලද සංඛ්‍යාව - 98 | | | √ |
| | අයාල ආඥාපනතට අනුව වැරදිකරුවන් වන පුද්ගලයින් සඳහා රැකවරණය හා ආරක්ෂාව සැපයීම. | ආරක්ෂාව හා රැකවරණය සලසන ලද සංඛ්‍යාව - 508 සමාජගත කල සංඛ්‍යාව - 13 | | | √ |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සිය ප්‍රතිපාදනයන්ට යටත්ව තිරසර සංවර්ධන අරමුණු 03ක් යටතේ වාර්ෂිකව ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් සකස් කරනු ලබයි. එලෙස 2025 වර්ෂය තුළ ද සැලසුම් කරන ලද බොහොමයක් වැඩසටහන් තුළින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට හැකියාව ලැබුණි.

# පරිච්ඡේදය 06

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව - 2025.12.31 දිනට

- ස්ථිර කාර්යය මණ්ඩලය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) * |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 11 | 06 | 05 |
| තෘතීයික | 518 | 220 | 101* |
| ද්විතියික | 716 | 638 | 71** |
| ප්‍රාථමික | 289 | 250 | 39 |

* තෘතියික මට්ටමට ඇතුළත් සමාජ සේවා නිලධාරි තනතුරු 494ක් අනුමත වුවද එම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කළ හැකි වනුයේ, MN 4 වැටුප් කාණ්ඩයේ දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති සංවර්ධන නිලධාරි තනතුරු අහෝසි වී ගිය පසුවය.

** එසේම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් වරින් වර සංවර්ධන නිලධාරින් අනුයුක්ත කිරිම හේතුවෙන් ද්විතියික මට්ටමට ඇතුළත් MN 4 සංවර්ධන නිලධාරි තනතුරු මේ වන විට අතිරික්තව ඇත. එබැවින් තෘතියික හා ද්විතියික මට්ටමට අදාළව සත්‍ය ලෙසම පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙහි දක්වා ඇත.

- කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) ** |
|---|---|---|---|
| වෛද්‍ය නිලධාරි | 01 | 0 | 1 |
| ඖෂධවේදී | 01 | 0 | 01 |
| පුනරුත්ථාපන සහායක | 09 | 0 | 09 |
| පෙර පාසල් ගුරු | 84 | 0 | 84 |
| උපස්ථායක | 53 | 0 | 53 |
| කාර්යාල කාර්ය සහායක | 12 | 0 | 12 |

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2025-12-31

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් කලය රා.ප.ච 03/2016 | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | 2 | 1 | 1 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ලං.ග.සේ | I | SL 1 | 1 | 1 | 0 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ලං.ග.සේ. | I | SL 1 | 1 | 0 | 1 |
| 5 | ගණකාධිකාරී | ශ්‍රී. ලං.ග.සේ. | II/ III | SL 1 | 2 | 1 | 1 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ප. සේ. | II/ III | SL 1 | 3 | 2 | 1 |
| 7 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ක්‍ර සේ. | II/ III | SL 1 | 1 | 0 | 1 |
| 8 | වෛද්‍ය නිලධාරී | කොන්ත්‍රාත් | | | 1 | 0 | 1 |
| 9 | පරිපාලන නිලධාරී | කළ.සේ.නි (අධි) | අධි ශ්‍රේණිය | MN 7 | 1 | 1 | 0 |
| 10 | ස්ථානභාර නිලධාරී | දෙපාර්තමේන්තුගත | විශේෂ | MN 7 | 22 | 3 | 19 |
| 11 | වැඩ කළමනාකරු | දෙපාර්තමේන්තුගත | විශේෂ | MN 7 | 1 | 0 | 1 |
| 12 | සමාජ සේවා නිලධාරී * | දෙපාර්තමේන්තුගත | I /II | MN 5 | 494 | 216 | 81 |
| 13 | භෞත චිකිත්සක | පරිපූරක වෛ.සේ. | I /II/ III | MT 6 | 1 | 0 | 1 |
| 14 | වෘත්තීය චිකිත්සක | පරිපූරක වෛ.සේ. | I /II/ III | MT 6 | 1 | 0 | 1 |
| 15 | කථන චිකිත්සක | දෙපාර්තමේන්තුගත | I /II/ III | MT 6 | 1 | 0 | 1 |
| 16 | ඖෂධවේදී | කොන්ත්‍රාත් | | | 1 | 0 | 1 |
| 17 | සමාජ සංවර්ධන සහකාර ** | ආශ්‍රිත සේවා | I /II/ III | MN 4 | 1 | 1 | 0 |
| 18 | සංවර්ධන නිලධාරී (සමාජ සේවා) *** | සං. නි. සේවය | I /II/ III | MN 4 | 219 | 261 | -42 |
| 19 | සංවර්ධන නිලධාරී (රිදියගම) | සං. නි. සේවය | I /II/ III | MN 4 | 7 | 6 | 1 |
| 20 | සංවර්ධන නිලධාරී (වැඩිහිටි/සමාජ සේවා) | සං. නි. සේවය | I /II/ III | MN 4 | 285 | 263 | 22 |
| 21 | ආධුනික භාෂා පරිවර්තක | ආශ්‍රිත සේවා කොන්ත්‍රාත් | | MN 4 | 1 | 0 | 1 |
| 22 | වෘත්තීය උපදේශක | දෙපාර්තමේන්තුගත | I /II/ III | MT 1 | 67 | 39 | 28 |
| 23 | තාක්ෂණික නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ | I /II/ III | MT 1 | 1 | 0 | 1 |
| 24 | තොරතුරු හා සන්නිවේදන හා තාක්ෂණ සහකාර | ශ්‍රී.ල.තො.ස.තා.ස.සේ. | I /II/ III | MT 1 | 1 | 0 | 1 |
| 25 | කළමනාකරණ සේවා නිලධාරී | කළමනාකරණ සේ.නි සේවය | I /II/ III | MN 2 | 67 | 47 | 20 |
| 26 | සංඥා භාෂා පරිවර්තක | දෙපාර්තමේන්තුගත | I /II/ III | MN 2 | 26 | 10 | 16 |
| 27 | පෙර පාසල් ගුරු | දෙපාර්තමේන්තුගත | I /II/ III | MN 1 | 10 | 2 | 8 |
| 28 | නිවාස පාලක / **පාලිකා** | දෙපාර්තමේන්තුගත | I /II/ III | MN 1 | 26 | 15 | 11 |
| 29 | සාත්තු සේවිකා*** | දෙපාර්තමේන්තුගත | I /II/ III | MN 1 | 2 | 2 | 0 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 30 | රියදුරු | රියදුරු සේවය | I /II/ III | PL 3 | 17 | 13 | 4 |
| 31 | අරක්කැමි **** | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 17 | 12 | 5 |
| 32 | විදුලි කාර්මික | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 1 | 0 | 1 |
| 33 | වඩු කාර්මික*** | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 1 | 1 | 0 |
| 34 | උපස්ථායක (රිදියගම) | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 38 | 34 | 4 |
| 35 | රැකවල්කරු***** | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 9 | 9 | 0 |
| 36 | ළමා සංවර්ධන සහායක | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 5 | 5 | 0 |
| 37 | අරක්කැමි සහයක | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 25 | 20 | 5 |
| 38 | උපස්ථායක | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 59 | 52 | 7 |
| 39 | කාර්යාල කාර්ය සහයක | කා.කා.සේ. | I /II/ III/special | PL 1 | 51 | 42 | 9 |
| 40 | කාර්යාල කාර්ය සහයක *** | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 2 | 23 | 19 | 0 |
| 41 | කම්කරු | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 10 | 9 | 1 |
| 42 | සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 20 | 20 | 0 |
| 43 | මුරකරු | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 13 | 13 | 0 |
| 44 | ජල පොම්ප ක්‍රියාකරු*** | දෙපාර්තමේන්තුගත | I /II/ III/special | PL 1 | 1 | 1 | 0 |
| 45 | පුනරුත්ථාපන සහයක | කොන්ත්‍රාත් | | PL 1 | 9 | 0 | 9 |
| 46 | පෙර පාසල් ගුරු | කොන්ත්‍රාත් | | MN1 | 84 | 0 | 84 |
| 47 | උපස්ථායක | කොන්ත්‍රාත් | | PL 1 | 53 | 0 | 53 |
| 48 | කාර්යාල කාර්ය සහායක | කොන්ත්‍රාත් | | PL 2 | 12 | 0 | 12 |
| | එකතුව | | | | **1695** | **1122** | **372** |

* සමාජ සංවර්ධන සහකාර තනතුරු දරන්නන් සමාජ සේවා නිලධාරී ලෙස බඳවාගන්නා තෙක් හා සංවර්ධන නිලධාරී තනතුරු 196 අහෝසි වන තෙක් සමාජ සේවා නිලධාරී තනතුරේ පුරප්පාඩු නොපිරවිය යුතුය.

** පුරප්පාඩු නොපිරවීමට යටත්ව

*** දරන්නාට පෞද්ගලික වන සේ පසුව අහෝසි වීමට යටත්ව

**** තනතුරු දෙකක් දරන්නාට පෞද්ගලික වන සේ පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇත

***** දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති අතර, මෙම තනතුර පුරප්පාඩු වීමේදී උපස්ථායක මුළු තනතුරු සංඛ්‍යාව 40 දක්වා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

**විශේෂ සටහන :** වෘත්තීය උපදේශක අනුමත තනතුරු 67 තුළ කොන්ත්‍රාත් පදනමින් පුරප්පාඩු පිරවීමට අනුමත කරන ලද තනතුරු 09ක් ඇතුළත් වන අතර, තත්‍ය කාර්ය මණ්ඩලය තුළද මේ වන විට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරියා ඇතුලත් කර ඇත.

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති අකාරය

සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත සමස්ථයක් ලෙස පවතිනුයේ කාර්ය මණ්ඩල හිඟයක් වේ. එසේ වුවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා අනුයුක්ත කිරීම හේතුවෙන් සංවර්ධන නිලධාරී තනතුරුවල අතිරික්තයක් පවතින නමුත්, දරන්නාට පෞද්ගලික වන සේ අනුමත සංවර්ධන නිලධාරී තනතුරු අහෝසි වන තෙක් සමාජ සේවා නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වීමත්, සත්‍ය ලෙසම සමාජ සේවා නිලධාරී තනතුරේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීමත් හේතුවෙන් අතිරික්ත සංවර්ධන නිලධාරීන් වෙත සමාජ සේවා නිලධාරී තනතුරේ පුරප්පාඩු පවතින සේවා ස්ථාන සඳහා අනුයුක්ත කර අදාළ කාර්යයන් ඉටු කර ගැනීම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලය තුළ ඵලදායීව මානව සම්පත ප්‍රයෝජනයට ගෙන ඇත.

පවතින මානව සම්පත සේවා අවශ්‍යතාවය අනුව සාධාරණව ව්‍යාප්ත කරලමින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම මඟින් අපේක්ෂිත කාර්ය සාධන මට්ටම කරා ළඟාවීමට මෙහෙයවන ලදි. ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීමේ දෙපාර්තමේන්තු කාර්යය භාරය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට මානව සම්පත අනුමත ප්‍රමාණයෙන් පැවතීම සුදුසු වේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 01 | සංඥා භාෂා නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පළමු වැඩසටහන - සංඥා භාෂාවේ නව ප්‍රවණතා | 8 | දින 1 | 8,080.00 | දේශීය | සංඥා භාෂාවේ නව ප්‍රවණතා |
| 02 | මුදල් රෙගුලාසි - ගෙවීම් පටිපාටිය සම්බන්ධ පුහුණු වැඩසටහන - ප්‍රධාන කාර්යාලීය නිලධාරීන් සඳහා | 52 | පැය 03 | 5,597.50 | දේශීය | මුදල් රෙගුලාසි - ගෙවීම් පටිපාටිය සම්බන්ධ දැනුම |
| 03 | පර්යේෂණ ක්‍රම හඳුන්වාදීම පිළිබඳ පළමු පුහුණු වැඩසටහන | 23 | දින 2 | 74,864.00 | දේශීය | පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ පුහුණු වැඩසටහන | 7 | දින 01 | 45,500.00 | දේශීය | පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ දැනුම |
| 05 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන (භෞතිකව හා මාර්ගගතව) | 123 | දින 01 | 1,23530.00 | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ දැනුම |
| 06 | සංඥා භාෂා නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ දෙවන වැඩසටහන | 8 | දින 01 | 9,675.00 | දේශීය | සංඥා භාෂාවේ නව ප්‍රවණතා |
| 07 | ආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කිරීම සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කිරීම සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 27 | දින 01 | 7930.00 | දේශීය | ආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කිරීම සම්බන්ධ දැනුම |
| 08 | සංඥා භාෂා නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ තෙවන වැඩසටහන - පොලිස් පැමිණිලි සටහන් කිරීම හා ඒ සම්බන්ධ නීතීන් හඳුන්වාදීම | 7 | දින 01 | 11,510.00 | දේශීය | සංඥා භාෂාවේ නව ප්‍රවණතා |
| 09 | නවක සංඥා භාෂා පරිවර්තක නිලධාරීන් සඳහා සංඥා භාෂා පුහුණු මොඩියුලය හඳුන්වා දීමේ දෙදින පුහුණු වැඩසටහන | 3 | දින 02 | 4,900.00 | දේශීය | සංඥා භාෂා පුහුණු මොඩියුලය පිළිබඳ දැනුම |
| 10 | මුදල් රෙගුලාසි - ගෙවීම් පටිපාටිය, භාණ්ඩ සමීක්ෂණය හා ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන - වෘත්තීය පුහුණු ආයතන නිලධාරීන් සඳහා | 49 | දින 01 | 44,962.50 | දේශීය | මුදල් රෙගුලාසි - ගෙවීම් පටිපාටිය, භාණ්ඩ සමීක්ෂණය හා ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳ දැනුම |
| 11 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පරිපාලනය (Administration) සම්බන්ධ පුහුණුව | 1 | පැය 2 | 7,000.00 | දේශීය | වෙබ් අඩවිය පරිපාලනය (Administration) පිළිබඳ දැනුම |
| 12 | රාජ්‍ය සේවක වැටුප් පරිවර්තන හා ගණනය කිරීම් සම්බන්ධ පුහුණු වැඩසටහන | 10 | දින 01 | 50,000.00 | දේශීය | රාජ්‍ය සේවක වැටුප් පරිවර්තන හා ගණනය කිරීම් දැනුම |
| 13 | රෝගීන් සඳහා සත්කාරක සේවය පිළිබඳදැනුවත් කිරීමේ වැඩසටහන | 70 | දින 01 | 64,250.00 | දේශීය | රෝගීන් සඳහා සත්කාරක |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | සේවය පිළිබඳ දැනුම |
| 14 | පර්යේෂණ කණ්ඩායම සඳහා පර්යේෂණ ක්‍රමවේදය හා ප්‍රශ්නාවලිය සැකසීමේ පුහුණු වැඩමුළුව | 31 | දින 01 | 31,000.00 | දේශීය | පර්යේෂණ ක්‍රමවේදය හා ප්‍රශ්නාවලිය සැකසීම පිළිබඳ විෂය දැනුම |
| 15 | CBR පුහුණු වැඩසටහන - ප්‍රධාන කාරයාලීය නිලධාරීන් සඳහා | 65 | දින 01 | 16,975.00 | දේශීය | CBR පිළිබඳ පුහුණුව |
| 16 | රාජ්‍ය වැටුප් සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 03 | 18,000.00 | දේශීය | රාජ්‍ය වැටුප් සැකසීම පිළිබඳ විෂය දැනුම |
| 17 | නිවාස පාලක නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලීය නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි හැඳින්වීම. | 15 | දින 01 | 109,950.00 | දේශීය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම |
| 18 | සංඥා භාෂා නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ නෙවන වැඩසටහන | 4 | දින 1/2 | 3,600.00 | දේශීය | සංඥා භාෂාවේ නව ප්‍රවණතා |
| 19 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දෙදින පුහුණුව | 1 | දින 02 | 12,000.00 | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ විෂය දැනුම |
| 20 | Copetency Development for Receptionist/Telephone Operators | 3 | දින 01 | 19,500.00 | දේශීය | Knoledge upgrading of Receptionist/ Telephone Operators |
| 21 | අරක්කැමි සහායක, උපස්ථායක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පෙර පුහුණු වැඩසටහන | 20 | දින 01 | 12,643.00 | දේශීය | අරක්කැමි සහායක, උපස්ථායක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පෙර පුහුණුව |
| 22 | Public Procurement Procedures පාඨමාලාව | 3 | දින 02 | 39,000.00 | දේශීය | මෝටර් රථ යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | කාර්යාල ක්‍රම පිළිබඳ දෙදින පුහුණුව | 6 | දින 02 | 72,000.00 | දේශීය | කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |
| 24 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | 75 | දින 1/2 | 18,250.00 | දේශීය | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන පනත පිළිබඳ දැනුම |
| 25 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය තෙදින පුහුණු වැඩමුළුව | 3 | දින 03 | 54,000.00 | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුම |
| 26 | පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 2 | දින 02 | 15,000.00 | දේශීය | පොත් බැඳුම්කරණය පිළිබඳ දැනුම |
| 27 | උපදේශනය ඇතුලත් ආතති කළමනාකරණ වැඩසටහන | 71 | දින 01 | 127,090.00 | දේශීය | ආතති කළමනාකරණ |
| 28 | රාජ්‍ය නිලධාරීන් සඳහා ගබඩා කළමනාකරණය පුහුණු වැඩසටයන | 2 | දින 01 | 13,000.00 | දේශීය | ගබඩා කළමනාකරණය පිළිබඳ දැනුම |
| 29 | වෘත්තීය පුහුණු ආයතන නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 56 | දින 01 | 84,213.00 | දේශීය | වෘත්තීය පුහුණු ආයතන නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දැනුම |
| 30 | සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටයන | 4 | දින 02 | 48,000.00 | දේශීය | සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය |
| 31 | Certificate Program in English for Office Management පුහුණු පාඨමාලාව | 1 | දින 10 | 25,000.00 | දේශීය | ඉංග්‍රීසි භාෂා පුහුණුව |
| 32 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දෙදින පුහුණුව | 1 | දින 01 | 12,000.00 | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 33 | නිවාඩු භාර නිලධාරියාගේ කාර්ය භාරය | 1 | දින 01 | 6,500.00 | දේශීය | නිවාඩු භාර නිලධාරියාගේ කාර්ය භාරය පිළිබඳ දැනුම |
| 34 | ඒකාබද්ධ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරිමේ වැඩසටහන | 56 | දින 1/2 | 112,300.00 | දේශීය | ඒකාබද්ධ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරිමේ පුහුණුව |
| 35 | මූලික විමර්ශනය පාඨමාලාව | 1 | දින 01 | 6,500.00 | දේශීය | මූලික විමර්ශනය පිළිබඳ දැනුම |
| 36 | ලිපිගොනුකරණය පාඨමාලාව | 1 | දින 01 | 6,500.00 | දේශීය | ලිපිගොනුකරණය පිළිබඳ දැනුම |
| 37 | රිදියගම නිවර්තන නිවාසයේ කාර්ය මණ්ඩලය සඳහා උපදේශන කුසලතා හා ධාරිතා සංවර්ධන වැඩසටහන | 120 | දින 02 | 29,713.00 | දේශීය | උපදේශනය හා ධාරිතා සංවර්ධන වැඩසටහන |
| 38 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව ආයතන නිලධාරීන් හා ප්‍රධාන කාර්යිලිය නිලධාරින් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව | 85 | දින 01 | 81,225.00 | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව දැනුම |
| 39 | රෝහල් සමාජ සේවා නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලීය නිලධාරීන් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන | 70 | දින 1/2 | 29,900.00 | දේශීය | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම |
| 40 | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ වැඩසටහනන - මාතර | 120 | දින 01 | 109,350.00 | දේශීය | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ දැනුම |
| 41 | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ වැඩසටහනන - අනුරාධපුර | 135 | දින 01 | 124,200.00 | දේශීය | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ දැනුම |
| 42 | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ වැඩසටහනන - කොළඹ | 140 | දින 01 | 189,000.00 | දේශීය | නව දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ දැනුම |
| 43 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 1 | දින 02 | 12,000.00 | දේශීය | ගිණුම්කරණ කාර්යභාරය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුම |
| 44 | කාර්යාල ක්‍රම පුහුණුව | 1 | දින 02 | 12,000.00 | දේශීය | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව |
| 45 | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව | 1 | දින 02 | 12,000.00 | දේශීය | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුවසහාය |
| | **විදේශ පුහුණු / වැඩසටහන්** | | | | | |
| | JICA Knowledge Co-Creation Program: Promotion Employment of Person with Disabilities (in Japan) | 01 | 2025. 09.01 – 2025. 10.11 | | | |

## ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

ආන්තික කරණයට හා අවාසි සහගත තත්වයට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබල ගැන්වීම සඳහා සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදීමය මැදිහත්වීම මගින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ මෙහෙවර වේ.

මෙම මෙහෙවර උදෙසා දායකවෙමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ විවිධ අංශ, ආයතන මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අනුයුක්තව නිලධාරීන් 1122 කට ආසන්න පිරිසක් සේවය කරනු ලබයි.

ඉලක්කගත ප්‍රජාව වෙත කාර්යක්ෂමව හා සඵලදායී සේවාවක් සැපයීම උදෙසා මෙම මානව සම්පත විෂයානුබද්ධ දැනුමෙන් හා ආකල්පමය වශයෙන් සංවර්ධන කිරීම අත්‍යාවශ්‍ය වන එම අරමුණ පෙරදැරිව සියලුම තනතුරු ආවරණය වන ලෙස පුහුණු වැඩසටහන් සිදුකිරීමට සැලසුම් කළද රජයේ වියදම් පාලනය සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට යටත්ව, අත්‍යාවශ්‍ය පුහුණු අවශ්‍යතාවන් හඳුනාගනිමින් අවම වියදමක් දරමින් සිදු කළ හැකිව තිබූ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

ඊනියාවේ තෘප්තිමත්භාවය, ආකල්ප සංවර්ධන වැඩසටහන් ,විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් , විෂයානුබද්ධ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන්, සහ විවිධ පුහුණු අවස්ථාවන් ලබාදීම සිදුකරන ලද අතර, විදේශීය වශයෙන් පුහුණු, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා ද නිලධාරීන් කිහිප දෙනෙකු සඳහා අවස්ථා උදාවිය. මෙම වැඩසටහන් අතුරින් ඇතැම් පුහුණු වැඩසටහන් රාජ්‍ය නොවන ආයතනයන්ගේ අනුග්‍රහය යටතේ සිදුකරන ලද අතර, දැනුමෙන්, කුසලතාවෙන් හා ධනාත්මක ආකල්පවලින් සන්නද්ධ මානව සම්පත දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහළ නැංවීම උදෙසා විශාල දායකත්වයක් සපයනු ලබයි.

# පරිච්ඡේදය 07

# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/ 1- 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | එක් විගණන විමසුමක් නිකුත් කර ඇත.ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම නිසා විගණන සැලැස්ම ක්‍රියාත්මක කර නැත. | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | එක් විගණන විමසුමක් නිකුත් කර ඇත.නිකුත් කර ඇති විගණන වාර්තාව ඉදිරිපත් කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම නිසා විගණන සැලැස්ම ක්‍රියාත්මක කර නැත. | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | එක් විගණන විමසුමක් නිකුත් කර ඇත.නිකුත් කර ඇති විගණන වාර්තාව ඉදිරිපත් කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම නිසා විගණන සැලැස්ම ක්‍රියාත්මක කර නැත. | |
| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය | අනුකූල නොවේ නම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා |

| | | (අනුකූල වේ/ අනුකූල නොවේ) | ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **9.6** | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| **10.1** | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **10.2** | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| **11.2** | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| **12.1** | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| **12.2** | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| **12.3** | වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| **13.1** | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| **14.2** | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | - | | |
| 15.3 | මු.රෙ.176 අනුව ගිහ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | | |
| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **18.2** | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |